(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 11(4).]

# පාර්ලිමේන්තුවේ අංක 11 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2014 ජූනි මස 06 වැනි සිකුරාදා**

---

## 2014 ජූනි මස 17 වැනි අඟහරුවාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— සමාගම් පනත සහ සමිති ආඥාපනත යටතේ නියෝග,— 2007 අංක 7 දරන සමාගම් පනතේ 477 හා 157(5) වැනි වගන්ති සමග කියවිය යුතු, 527 වැනි වගන්තිය යටතේ, සහ 2005 අංක 11 දරන සමිති ආඥාපනත (සංශෝධන) පනත සමග කියවිය යුතු, 1891 අංක 16 දරන (123 වැනි අධිකාරය වූ) සමිති ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 දෙසැම්බර් 18 දිනැති අංක 1841/8 දරන අති විශේෂ ගැසට්පත්‍රයේ සහ 2014 ජනවාරි 27 දිනැති අංක 1847/2 දරන අති විශේෂ ගැසට්පත්‍රයේ පළ කරනු ලැබ, 2014.06.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## 2014 ජූනි මස 18 වැනි බදාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2671/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මිරිදිය ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවර තොටුපළවල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම තොටුපළවල් ආශ්‍රිතව මිරිදිය ධීවර කර්මාන්තයේ නියැළෙන පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 2006 සිට 2012 දක්වා මිරිදිය ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම උදෙසා වාර්ෂිකව වෙන් කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම මුදල ඉහත එක් එක් වර්ෂයේදී ධීවර අමාත්‍යාංශයට වෙන් කළ මුළු මුදලේ ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත කාල සීමාව තුළදී මිරිදිය ධීවර කර්මාන්තය වෙනුවෙන් ප්‍රමාණවත් මුදලක් වෙන් කර තිබුණේද;

(ii) මිරිදිය ධීවර කර්මාන්තයේ නියැළෙන ධීවරයන්ට ධීවර ආම්පන්න ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මකවේද;

(iii) එසේ නම්, එම වැඩසටහන කවරේද;

(iv) එම වැඩසටහන මිරිදිය ධීවරයින්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත්වේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 ජූලි මස 08 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2662/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් වන පරිදි අපනයන බෝග වගාකරුවන් දිරිමත් කිරීම සඳහා දැනට හඳුන්වා දී ඇති "කෘෂි අපනයන කලාප" රට පුරා ව්‍යාප්ත කර තිබේද;

(ii) එසේ නම්, එම "කෘෂි අපනයන කලාප" රට පුරා ව්‍යාප්ත කිරීමට අදාළ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3233/'12

ගරු රවී කරුණානායක මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) මාර්ග සංවර්ධන අධිකාරියට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට පවතින ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකු වෙනුවෙන් දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3448/'13

ගරු පී. හැරිසන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අධ්‍යාපන සේවා කොමිෂන් සභාවේ නියමයන්ට අනුව විෂය අධ්‍යක්ෂ තනතුර සඳහා සපුරා තිබිය යුතු අවම සුදුසුකම් කවරේද;

(ii) උතුරු මැද පළාතේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සේවය කරන විෂය අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත අධ්‍යක්ෂවරුන් අතරින් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II සහ III ශ්‍රේණිවලට අයත් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් එම ශ්‍රේණිවලට අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත එක් එක් විෂය අධ්‍යක්ෂවරයාට පවරාදී තිබෙන විෂය හා රාජකාරි කටයුතු කවරේද;

(v) එම විෂය අධ්‍යක්ෂවරුන් අතරින් ගරු සේවයේ යෙදී සිටින සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සිටින නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිලධාරීන් ඉහත සඳහන් විෂය අධ්‍යක්ෂ තනතුරු සඳහා පත් නොකිරීමට හේතුව කවරේද;

(iii) එම අධ්‍යක්ෂවරුන්ගේ අමතර දීමනා හා ගෙවීම් සිදුකරනු ලබන්නේ පළාත් සභාවෙන්ද; නැතහොත්, මධ්‍යම ආණ්ඩුවෙන්ද;

(iv) අධ්‍යාපන සේවා කොමිෂන් සභාව මගින් උතුරු මැද පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට අනුමත ක්‍රියා පටිපාටියට බාහිරින් විෂය අධ්‍යක්ෂවරුන් බඳවා ගැනීම සඳහා විශේෂ බලයක් ලබා දී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3626/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන්ඇසීමට,— (2)

(අ) කොළඹ සුගතදාස ක්‍රීඩා පිටියේ අලුතින් අතුරන ලද "සැන්ට්ච්" ධාවන පථය අලුත්වැඩියා කිරීමේ තත්ත්වයක් ඇතිවී තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත කරුණු සොයා බැලීමට ක්‍රීඩා අමාත්‍යාංශය විසින් කමිටුවක් පත් කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එම කමිටුවේ සාමාජිකයන් කවුරුන්ද;

(iii) එම කමිටුව පත් කළ දිනය කවරේද;

(iv) එම කමිටුවේ නිර්දේශයන් කවරේද;

(v) ඉහත සඳහන් නව ධාවන පථයේ ඉදිකිරීම් කටයුතු භාරදුන් සමාගම හෝ පුද්ගලයින් කවුරුන්ද;

(vi) එහි ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් සොයා බැලීමට ජනාධිපති විමර්ශන ඒකකයෙන්ද කමිටුවක් පත් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3689/'13

ගරු අනුර දිසානායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2012 වර්ෂය තුළ රැකියාවන් සඳහා විදේශගතවූ සමස්ත ශ්‍රී ලාංකිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පිරිස පුහුණු, නුපුහුණු, අර්ධ පුහුණු මධ්‍යම මට්ටම, ලිපිකරු, ගුවන්සේවිකා හා වෙනත් යන වර්ගීකරණයන් යටතේ වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) විදේශගතවූ ඉහත පිරිසට අයත් කාන්තාවන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත (ii) හි එක් එක් කාණ්ඩය යටතේ වූ කාන්තාවන් සංඛ්‍යාව, අදාළ වර්ෂයේ විදේශගත වූ සමස්ත කාන්තා ශ්‍රමිකයන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3738/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ කුඹුරු ඉඩම් ගොඩකරනු ලබන බවට ජනතාව චෝදනා කරන බව දන්නේද;

(ii) 2005 වර්ෂයේ සිට මේ දක්වා එම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ අනවසරයෙන් ගොඩකර ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම අනවසර ගොඩකිරීම්වලට අදාළව පැමිණිලි ලැබී තිබේද;

(iv) එසේ නම්, ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(v) එම පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා නීත්‍යානුකූලව කටයුතු කර තිබේද;

(vi) ඒ අනුව ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ කුඹුරු ඉඩම් ගොඩකිරීමට නීත්‍යානුකූල අවසරය ලබාගෙන තිබේද;

(ii) එසේ නම්, ගොඩකිරීම සඳහා අවසර ලබා දී ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම කුඹුරු ඉඩම් ගොඩකිරීමට අවසර ලබාදීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3823/'13

ගරු පී. හැරිසන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි වකුගඩු රෝගීන්ගේ ලේ පිරිසිදු කිරීම් කටයුතු සිදු කරන රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම රෝහල් කවරේද;

(iii) එම එක් එක් රෝහලේ ඇති ලේ පිරිසිදු කිරීමේ යන්ත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් රෝහලේ එක් දිනක් තුළ ලේ පිරිසිදු කිරීම් සඳහා භාජනය වන රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(v) වකුගඩු රෝගීන්ගේ රුධිරය පිරිසිදු කිරීමේ කාර්යයන් සඳහා අනුයුක්ත කර ඇති වෛද්‍යවරුන් සහ හෙද කාර්ය මණ්ඩලය එම එක් එක් රෝහල අනුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇති සෞඛ්‍ය සේවා කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම කාර්යාල හරහා මේ වන විට හඳුනාගෙන ඇති වකුගඩු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) අනුරාධපුර මහ රෝහලේ වකුගඩු බද්ධ කිරීම් කටයුතු සිදු කරනු ලබන්නේද;

(ii) එසේ නම්, එම කටයුතු ආරම්භ කළ දිනය කවරේද;

(iii) වකුගඩු බද්ධ කිරීමක් දැනට සිදු නොකරන්නේ නම්, එයට ඇති අපහසුතා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4227/'13

ගරු රන්ජන් රාමනායක මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2004 වර්ෂයේ සිට මේ දක්වා මහජන ඡන්දයෙන් තේරී පත්වූ ප්‍රාදේශීය සභා නියෝජිතයින්, නගර සභා නියෝජිතයින් සහ පළාත් සභා නියෝජිතයින් අතරින් මේ වන විට දූෂණ, අපරාධ හෝ වෙනත් නීති විරෝධී ක්‍රියා සිදුකිරීම හේතුවෙන් චෝදනා එල්ලවී ඇති සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, අයත් දේශපාලන පක්ෂ සහ ඔවුන් පළාත් සභාවේ, නගර සභාවේ හෝ ප්‍රාදේශීය සභාවේ දැරූ හෝ දැනට දරන තනතුරු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් මහජන නියෝජිතයින් අතරින් මේ වන විට නීති මඟින් කටයුතු කිරීම ආරම්භකර ඇති සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වන විට නීතිය ඉදිරියට පමුණුවා වරදකරුවන් වී, දඬුවම් ලැබූවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත පරිදි දූෂිත පිරිස් පළාත් සභා සහ පළාත් පාලන ආයතන නියෝජනය කිරීම සංවිධානාත්මක දූෂණ, අපරාධ හා නොයෙකුත් නීති විරෝධී ක්‍රියාකාරකම් තවදුරටත් සිදුවීමට හේතු වී ඇති බව පිළිගන්නේද;

(ii) නීති විරෝධී ක්‍රියාවන්හි යෙදෙන දූෂිතයන් හා අපරාධකරුවන් ප්‍රාදේශීය හා පළාත් සභා දේශපාලනයට පිවිසීම වැළැක්වීම සඳහා ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4560/'13

ගරු මොහමඩ් අස්ලම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මවුලවි ගුරුවරුන් 424 දෙනෙකු බඳවා ගැනීම පිණිස 2008.08.29 දින අංක 1565 දරන රජයේ ගැසට් නිවේදනය මඟින් අයදුම්පත් කැඳවන ලද බවත්;

(ii) එම තරග විභාගය සමත් වූ පිරිස අතරින් 148 දෙනෙකුට 2010 වර්ෂයේදී පත්වීම් ලබා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එකී තරග විභාගයෙන් අවශ්‍ය ලකුණු ප්‍රමාණය ලබා ගෙන සම්මුඛ පරීක්ෂණයටද ඉදිරිපත් වූ අයදුම්කරුවන් 276 දෙනෙකුට මෙතෙක් මවුලවි ගුරු පත්වීම් ලබා නොදීමට හේතු කවරේද;

(ii) එම අයදුම්කරුවන්ටද නොපමාව මවුලවි ගුරු පත්වීම් ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4568/'13

ගරු දුනේෂ් ගන්කන්ද මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් විසින් වැඩිම විදේශ විනිමය ප්‍රමාණයක් ශ්‍රී ලංකාවට උපයා දෙන මැද පෙරදිග රටවල් දහය කවරේද;

(ii) එම එක් එක් රටෙහි සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම සෑම රටකම ශ්‍රී ලංකා තානාපති කාර්යාල පිහිටා තිබේද;

(iv) එම එක් එක් තානාපති කාර්යාලයෙහි සේවය කරනු ලබන භාෂා පරිවර්තක නිලධාරීන් සහ කම්කරු නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම රටවල සේවය කරනු ලබන ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් සංඛ්‍යාවට සාපේක්ෂව ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් තානාපති කාර්යාලවල සේවයේ යොදවා නොමැති බව පිළිගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් එම රටවලදී පොලිස් අත්අඩංගුවට පත්වුවහොත් එම අවස්ථාවේදීම ඒ බව ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලට දැනුම් දීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් සකස් වී තිබේද;

(ii) ශ්‍රී ලංකාව සහ එම රටවල් අතර අවබෝධතා ගිවිසුම් ඇති කර එවැනි ක්‍රමවේදයක් සකසා ගැනීම තුළ නීතිමය ප්‍රශ්නවලට මුහුණ දෙන ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ට තානාපති කාර්යාලවල රැකවරණය ලබා ගැනීම සඳහා අවස්ථාව සැලසෙන බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4628/'13

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දැනට ජීවන වියදම් දීමනාව ගණනය කෙරෙන ආකාරය කවරේද;

(ii) ජීවන වියදම් දීමනාවේ ඒකක අගය (ඒකකයකට රුපියල්වලින්) ගණනය කෙරෙන ආකාරය කවරේද;

(iii) ඉහත සඳහන් අගය (ඒකක අගය) අවසන් වරට ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන ලද්දේ කවදාද;

(iv) ඉහත කී ඒකක පිරිවැය අවසන් වරට ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමේ සිට එය සංශෝධනය කිරීමට හේතු ඇති වී තිබේද;

(v) එසේ නම්, ජීවන වියදම් දීමනාවේ නව ඒකක අගය හඳුන්වා දෙමින් ගැසට් පත්‍රයක් ප්‍රකාශයට පත් කිරීමට උපදෙස් දෙනු ලබන්නේ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4662/'13

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 වර්ෂයේ ජනවාරි මස සිට සැප්තැම්බර් මස දක්වා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මත්පැන් බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) 2008 වර්ෂයේ ජනවාරි සිට 2013 වර්ෂයේ සැප්තැම්බර් දක්වා කාල සීමාව වෙනුවෙන් මත්පැන් බලපත්‍ර නිකුත් කරන ලද සමාගම් වෙතින් රැස් කර ගන්නා ලද සුරා බදු ප්‍රමාණය වාර්ෂික පදනමින් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මත්පැන් බලපත්‍ර නිකුත් කරනු ලදුව, 2012 සහ 2013 වර්ෂ වෙනුවෙන් සුරා බදු ගෙවීම පැහැර හරින ලද කවර හෝ සමාගම් තිබේද;

(ii) එසේ නම්, එම ගෙවීම් පැහැර හරින ලද සමාගම්වල නම් කවරේද;

(iii) එකී එක් එක් සමාගමෙන් අයවිය යුතු මුළු සුරා බදු හිඟ මුදල කොපමණද;

(iv) ඉහත සඳහන් කරන ලද කවර හෝ සමාගමක මත්පැන් බලපත්‍ර සුරාබදු දෙපාර්තමේන්තුව විසින් අලුත් කරනු ලැබ තිබේද;

(v) එසේ නම්, එම සමාගම්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4804/'14

ගරු අබ්දුල් හලීම් මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ජීවත්වන ජනතාවගෙන් 70%ක් දෙමළ භාෂාව කතා කරන පිරිසක් බවත්;

(ii) අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරනු ලබන ප්‍රාදේශීය ලේකම්, සහකාර ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් විධායක නිලධාරීන්ගෙන් බහුතරයක් දෙමළ භාෂාවෙන් රාජකාරි කළ නොහැකි පිරිසක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වන විට අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරනු ලබන දෙමළ භාෂාවෙන් රාජකාරි ඉටු කිරීමට හැකි නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දෙමළ භාෂාවෙන් රාජකාරි කළ හැකි ප්‍රාදේශීය ලේකම්වරයෙක් පත් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4806/'14

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මස්කෙළිය ප්‍රදේශයේ ඇති වතු 56 ක පමණ ඇති කරනු ලබන ගවයන්ට වෛද්‍ය සේවා සැපයීම සඳහා පශු වෛද්‍යවරයෙකු නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) මස්කෙළිය පශු වෛද්‍ය කාර්යාලයට ස්ථිර පශු වෛද්‍යවරයෙක් හා සහායක පශු වෛද්‍යවරයෙක් පත් කිරීමට අවශ්‍ය කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4815/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අස්ථානගත වූ වාහන ආදායම් බලපත්‍රයක් වෙනුවෙන් පිටපතක් ලබා ගැනීමේදී එම බලපත්‍රය නැති වූ දින සිට ඉදිරි කාලය වෙනුවෙන් සම්පූර්ණ බලපත්‍ර ගාස්තුවම නැවත බලපත්‍ර හිමියාගෙන් අය කර ගන්නා බව එතුමා දන්නෙහිද?

(ආ) අදාළ වර්ෂය වෙනුවෙන් ආදායම් බලපත්‍රය සඳහා ගාස්තු ගෙවා රජයේ ආදායමට බැර කර තිබියදී, එකී බලපත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා නැවත සම්පූර්ණ බලපත්‍ර ගාස්තුවම අය කිරීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) සාමාන්‍ය කඩදාසියක මුද්‍රිත වාහන ආදායම් බලපත්‍රය විනාශ වීමට හෝ අස්ථානගත වීමට වැඩි හැකියාවක් ඇති බව පිළිගන්නේද;

(ii) එබැවින්, එම බලපත්‍රයේ පිටපතක් ලබා ගැනීමේදී ඒ සඳහා වැය වන පිරිවැය පමණක් අය කර එය නිකුත් කිරීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 ජූලි මස 09 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2664/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් වන පරිදි ආගමික වශයෙන් වැදගත් වන අනුරාධපුරය, පොළොන්නරුව, කතරගම, මන්නාරම මඩු දේවස්ථානය වැනි ප්‍රදේශවල ආබාධිත රණවිරුවන් සඳහා නවීන ගිමන්හල් පද්ධතියක් ඉදිකිරීමට කටයුතු සලසා තිබේද;

(ii) එසේ නම්, එම ගිමන්හල් පද්ධතිය ඉදිකිරීමේ වැඩසටහනට අදාළ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3242/'12

ගරු රවී කරුණානායක මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ලංකා ධීවර සංස්ථාවට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වනවිට තිබෙන ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකුට දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3449/'13

ගරු පී. හැරිසන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) විදුහල්පතිවරුන් හා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් බඳවා ගැනීමේ බලය මධ්‍යම රජයේ අධ්‍යාපන සේවා කොමිෂන් සභාව සතුවූවක්ද;

(ii) උතුරු මැද පළාත් සභා අමාත්‍ය මණ්ඩලය විසින් එම බලතල අභිභවමින් පළාත් අධ්‍යාපන සේවය සඳහා නිලධාරීන් බඳවා ගැනීමේ බලතල එම පළාත් සභාවට ලබා දී තිබේද;

(iii) නොඑසේ නම්, උතුරු මැද පළාත් අධ්‍යාපන කාර්යාලවල අනුයුක්ත ගුරු සේවයේ නිලධාරීන් විෂය අධ්‍යක්ෂ ධුර සඳහා බඳවා ගැනීම සිදුකර ඇති ක්‍රියා පටිපාටිය කවරේද;

(iv) පළාත් සභාව මගින් මධ්‍යම ආණ්ඩුවේ අනුමතියකින් තොරව බඳවා ගත් නිලධාරීන් සඳහා ගමන් වියදම් හා අමතර දීමනා ගෙවීම් සිදුකරන ආකාරය කවරේද;

(v) එම ගෙවීම් සිදුකරන්නේ උතුරු මැද පළාත් සභාවේ කවර වැය ශීර්ෂය යටතේද;

(vi) එම නිලධාරීන් සඳහා මුදල් ගෙවීම මධ්‍යම ආණ්ඩුවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමතිය යටතේ සිදුකරන්නේද;

(vii) එම මුදල් ගෙවීමේදී රජයේ මුදල් අයථා ලෙස භාවිත කොට තිබේ නම්, එසේ සිදුකළ නිලධාරීන්ට විරුද්ධව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3704/'13

ගරු අනුර දිසානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර සිට බෙලිඅත්ත දක්වා දුම්රිය මාර්ගයක් සකස් කිරීමට යෝජනා කර තිබේද;

(ii) එසේ නම්, එහි දුර ප්‍රමාණය කොපමණද;

(iii) එම දුම්රිය මාර්ගය ඉදිකිරීම සම්බන්ධයෙන් දැනට ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

(iv) එම දුම්රිය මාර්ගය සකස් කිරීම වෙනුවෙන් දරනු ලබන සමස්ත පිරිවැය කොපමණද;

(v) එම පිරිවැය සපයා ගනු ලබන ආකාරය කවරේද;

(vi) එම පිරිවැය ණය මගින් සපයා ගනු ලබන්නේ නම්, ණය ලබා ගන්නා ආයතනය කවරේද;

(vii) එම ණය වෙනුවෙන් ගෙවිය යුතු පොලී අනුපාතය සහ ඊට අදාළ කොන්දේසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මාතර - බෙලිඅත්ත දුම්රිය මාර්ගය ඉදිකිරීමේ කටයුතු පවරා ඇති සමාගම කවරේද;

(ii) එම සමාගම තෝරා ගනු ලැබීමේදී විධිමත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කළේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3739/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ කුඹුරු ඉඩම් ගොඩකරනු ලබන බවට ජනතාව චෝදනා කරන බව දන්නේද;

(ii) 2005 වර්ෂයේ සිට මේ දක්වා එම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ අනවසරයෙන් ගොඩකර ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම අනවසර ගොඩකිරීම්වලට අදාළව පැමිණිලි ලැබී තිබේද;

(iv) එසේ නම්, ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(v) එම පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා නීත්‍යානුකූලව කටයුතු කර තිබේද;

(vi) ඒ අනුව ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ කුඹුරු ඉඩම් ගොඩකිරීමට නීත්‍යානුකූල අවසරය ලබාගෙන තිබේද;

(ii) එසේ නම්, ගොඩකිරීම සඳහා අවසර ලබා දී ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම කුඹුරු ඉඩම් ගොඩකිරීමට අවසර ලබා දීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3908/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගම්පහ දිස්ත්‍රික්කයේ, ජා-ඇල නගරයට යාබද දඬුගම ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන සත්ව ගාල් සංඛ්‍යාව සහ සත්ව ඝාතකාගාර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ප්‍රදේශයේ නිරන්තරව එකතු වන ජීව අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන වැඩපිළිවෙළ කවරේද;

(iii) එම අපද්‍රව්‍යවලට අදාළව යම් පාරිසරික හා සෞඛ්‍ය සංරක්ෂණ වැඩපිළිවෙළක් ක්‍රියාත්මකවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4320/'13

ගරු අනෝමා ගමගේ මහත්මිය,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2013 වර්ෂයේ අගෝස්තු මස අවසානය වන විට දිවයිනේ වී ගබඩාවල තිබූ වී තොග ප්‍රමාණය කොපමණද;

(ii) එම වී තොග පසුගිය මහ කන්නයේ මිලදී ගනු ලැබූ ඒවාද;

(iii) නොඑසේ නම්, ඊටත් වඩා පැරණි වී තොග එම ගබඩා තුළ තිබුණේද;

(iv) එම වී තොග ජනතාවගේ පරිභෝජනය සඳහා නිකුත් නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2013 වර්ෂයේ යල කන්නය සඳහා අපේක්ෂා කරන ලද වී අස්වැන්න කොපමණද;

(ii) එම අස්වැන්න මිලදී ගැනීමට හා ගබඩා කිරීමට සැලසුම් කරනු ලැබුවේද;

(iii) එම වැඩසටහන කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4416/'13

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) නොරොච්චෝලේ විදුලි බලාගාරයේ සිට අනුරාධපුරය දක්වා විදුලිය සම්ප්‍රේෂණය කරන කිලෝවොට් 220 අධි සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම නිසා අගතියට පත් පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සෑම පවුලකටම වන්දි ගෙවා තිබේද;

(iii) එලෙස ගෙවා ඇති වන්දි මුදල්වල වටිනාකම කොපමණද;

(iv) ඉහත සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීමේදී මෙතෙක් වන්දි නොලැබුණු අවතැන්වූ පිරිසක් සිටින්නේද;

(v) එම පිරිසට වන්දි ගෙවීම ප්‍රමාදවීමට හේතු කවරේද;

(vi) ඉහත ව්‍යාපෘතියට අදාළව ගෙවිය යුතු සියලුම වන්දි මුදල් ගෙවා අවසන් කිරීමට ගතවන කාලය කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4664/'13

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ රෝහල් වෙනුවෙන් ඖෂධ මිලදී ගැනීම සඳහා වගකිව යුතු ආයතනය/ ආයතන කවරේද;

(ii) රජයේ රෝහල් වෙත ඖෂධ බෙදා හැරීම සඳහා වගකිව යුතු ආයතනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2011, 2012 සහ 2013 වර්ෂවලදී රජයේ රෝහල්වල ඖෂධ හිඟයක් පැවතුණිද;

(ii) එසේ නම්, එකී වර්ෂවලදී ඖෂධවල හිඟයක් වාර්තා කළ රජයේ රෝහල්වල නම් කවරේද;

(iii) එකී ඖෂධ හිඟයන්ට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4740/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ මේ වන විට වැසී ගොස් ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) වැසී ඇති එම පාසල් ගොඩනැගිලිවලින් ප්‍රයෝජනයක් ලබා ගන්නේද;

(iii) නැවත ආරම්භ නොකරන පාසල්වල ගොඩනැගිලි වෘත්තීය පුහුණු වැඩසටහන් ආරම්භ කිරීම සඳහා ලබා දෙන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4805/'14

ගරු අබ්දුල් හලීම් මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරි වසම් 35 තුළ වෙසෙන දෙමළ කථා කරන බහුතර ජනතාව වෙනුවෙන් සේවය කිරීම සඳහා දෙමළ භාෂාවෙන් වැඩ කළ හැකි ග්‍රාම නිලධාරීන් පස් දෙනෙකු පමණක් පත් කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් ග්‍රාම නිලධාරි වසම් 35 අතරින් දෙමළ කථා කරන ප්‍රජාව නියෝජනය කරන ග්‍රාම නිලධාරී වසම් 21 සඳහා දෙමළ භාෂාව කථා කළ හැකි ග්‍රාම නිලධාරීන් පත් කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4807/'14

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උකුවෙල නගරය සහ අවට ප්‍රදේශවල ජීවත් වන ද්‍රවිඩ දරුවන්ට උසස් පෙළ දක්වා අධ්‍යාපනය ලැබීමට ද්‍රවිඩ මාධ්‍ය පාසලක් නොමැති බවත්;

(ii) දළ වශයෙන් 700 කට වැඩි ද්‍රවිඩ සිසු සිසුවියන් පිරිසකට අධ්‍යාපනය හැදෑරීමට හැකි පාසලක් ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය ඉඩම් ප්‍රමාණය ලබාදීමට දෙමව්පියන් සූදානමින් සිටින බව දැනුම් දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) උකුවෙල නගරය සහ ආශ්‍රිත වතු ප්‍රදේශවල ජීවත් වන ද්‍රවිඩ ළමුන්ගේ අධ්‍යාපන සුබ සාධනය වෙනුවෙන් ද්‍රවිඩ මාධ්‍ය පාසලක් ස්ථාපිත කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4867/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014.02.19 දින ශ්‍රී ලංකා පොලිසියේ උසස් නිලධාරීන් සඳහා මෝටර් රථ ලබා දුන්නේද;

(ii) එසේ නම්, එම වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2666/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් වන පරිදි රට පුරා විසිරී සිටින ත්‍රිරෝද රථ හිමියන්ට හා රියදුරන්ට සමාරක්ෂණ ක්‍රමවේදයක් හඳුන්වා දී තිබේද;

(ii) එලෙස සමාරක්ෂණ ක්‍රමවේදයක් හඳුන්වා දී තිබේ නම්, එම රක්ෂණ ක්‍රමයට අදාළ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3243/'12

ගරු රවී කරුණානායක මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට අදාළව;

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;
(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;
(iii) අද වන විට තිබෙන ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;
(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;
(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;
(vi) එම ආයතනය සේවකයෙකුට දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;
(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 ජූලි මස 10 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2667/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට පවුල් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සේවයේ නිරතව සිටින පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් සංඛ්‍යාව කොපමණද;
(ii) මෙම පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්ට එම සේවය ලබාදීම සඳහා ප්‍රමාණවත් පහසුකම් සලසා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3244 /'12

ගරු රවී කරුණානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;
(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;
(iii) අද වන විට තිබෙන ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;
(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;
(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;
(vi) එම ආයතනය සේවකයෙකුට දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;
(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3710/'13

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයාගේ නිල කාර්ය මණ්ඩලය සඳහා අනුමත නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) වත්මන් ජනාධිපතිවරයාගේ නිල කාර්ය මණ්ඩලයේ සිටින සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) එම කාර්ය මණ්ඩලයට අයත් එක් එක් තනතුර හා ඊට අදාළ වගකීම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම තනතුරු දරන එක් එක් අයගේ නම, අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම කාර්ය මණ්ඩලය වෙනුවෙන් ගෙවනු ලබන වැටුප සහ අනෙකුත් සියලු පහසුකම් හා දීමනාවන් කවරේද;

(vi) ඒ අනුව ජනාධිපති කාර්ය මණ්ඩලය වෙනුවෙන් පසුගිය වර්ෂ 3 තුළ දැරූ පිරිවැය කොපමණද;

(vii) එම පිරිවැයට සාපේක්ෂව ඉහත කාර්ය මණ්ඩලය සෑහීමකට පත්විය හැකි අන්දමේ ප්‍රමාණවත් කාර්යභාරයක් ඉටු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3740/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොටපොල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ කුඹුරු ඉඩම් ගොඩකරනු ලබන බවට ජනතාව චෝදනා කරන බව දන්නේද;

(ii) 2005 වර්ෂයේ සිට මේ දක්වා එම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ අනවසරයෙන් ගොඩකර ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම අනවසර ගොඩකිරීම්වලට අදාළව පැමිණිලි ලැබී තිබේද;

(iv) එසේ නම්, ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(v) එම පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා නීත්‍යානුකූලව කටයුතු කර තිබේද;

(vi) ඒ අනුව ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා කොටපොල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ කුඹුරු ඉඩම් ගොඩකිරීමට නීත්‍යානුකූල අවසරය ලබාගෙන තිබේද;

(ii) එසේ නම්, ගොඩකිරීම සඳහා අවසර ලබා දී ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම කුඹුරු ඉඩම් ගොඩකිරීමට අවසර ලබා දීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3745/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මේ වන විට රාජ්‍ය සේවයේ සිටින,

(i) සමස්ත සේවක සංඛ්‍යාව;

(ii) එම සංඛ්‍යාවෙන් කාන්තා ප්‍රතිශතය;

(iii) අමාත්‍යාංශ ලේකම්වරු සංඛ්‍යාව;

(iv) අමාත්‍යාංශ ලේකම් ධූර දරන කාන්තාවන් සංඛ්‍යාව;

(v) අමාත්‍යාංශ ලේකම් ධූර නොදරන ශ්‍රී ලංකා පරිපාලන සේවා නිලධාරීන් සංඛ්‍යාව;

(vi) ඉහත (v) හි නිලධාරීන් අතර සිටින නිලධාරිනියන් සංඛ්‍යාව;

(vii) එක් එක් ශ්‍රේණිය අනුව එම නිලධාරිනියන්ගේ ප්‍රතිශතය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3828/'13

ගරු පී. හැරිසන් මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ මේ වන විට මත්පැන් අලෙවි කිරීම සඳහා ලබා දී ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) එම මත්පැන් බලපත්‍ර සංඛ්‍යාව වෙළෙඳසැල්, හෝටල් හා වෙනත් ආයතන අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 1994 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාල සීමාව තුළ වාර්ෂිකව අලුතින් ලබාදී ඇති මත්පැන් බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2005 - 2012 කාල සීමාව තුළ ඵුඩ් සිටි වෙළඳසැල්, සතොස වෙළඳසැල්, හෝටල් හා අනෙකුත් වෙළඳසැල් සඳහා අලුතින් නිකුත්කර ඇති මත්පැන් බලපත්‍ර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) දැනට ලබාදී ඇති මත්පැන් අලෙවි බලපත්‍ර සංඛ්‍යාව දිස්ත්‍රික්ක අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම බලපත්‍ර ලබාදීම තුළින් රජයට ලැබෙන ආදායම දිස්ත්‍රික්ක අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) රටබීම අලෙවි බලපත්‍ර ලබාදීම, ගම්බද නීති විරෝධී මත්පැන් පානය අඩුවීමට හේතුවී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3924/'13

ගරු සුජීව සේනසිංහ මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට වරායේ බාජ් එකක් තිබේද;

(ii) එහි බහාලුම් මෙහෙයවීම සඳහා සවිකර ඇති දොඹකර සංඛ්‍යාව කොපමණද:

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වෙනත් ගමනාන්ත කරා යන අතරතුර ඉන්ධන ලබා ගැනීම සඳහා පමණක් හම්බන්තොට වරායට මේ දක්වා පැමිණ ඇති නැව් සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපතිතුමා විසින් සඳහන් කරනු ලබන පරිදි හම්බන්තොට වරායේ ස්ථිර සේවකයින් 5000ක් පමණ සේවය කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4332/'13

ගරු අනෝමා ගමගේ මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මෙරට ක්‍රියාත්මක වන අධ්‍යාපන විද්‍යාපීඨ සංඛ්‍යාව එක් එක් විෂයය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2013 වර්ෂයේදී එක් එක් විද්‍යාපීඨයේ අධ්‍යාපනය ලැබූ සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අධ්‍යාපන විද්‍යාපීඨවල සේවය කරන පීඨාධිපතිවරුන්ගේ නම් හා සුදුසුකම් කවරේද;

(ii) විද්‍යාපීඨ පීඨාධිපති තනතුර දැරීම සඳහා තිබිය යුතු අවම සුදුසුකම් කවරේද;

(iii) එම විද්‍යාපීඨවල කථිකාචාර්යවරුන්ගේ හිඟයක් පවතින්නේද;

(iv) එසේ නම්, කථිකාචාර්ය හිඟය පවතින විද්‍යාපීඨ සහ විෂයයන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4753/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාලු වරාය සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කල දිනය කවරේද;

(ii) දැනට එම ව්‍යාපෘතියේ වැඩ නිම වී තිබේද;

(iii) වර්ෂ 2008 සිට 2013 දක්වා කාල සීමාව තුළ දී ගාලු වරායට පැමිණි නැව් සංඛ්‍යාව කොපමණද;

(iv) මෙම ව්‍යාපෘතියේ දෙවැනි අදියර සඳහා උපදේශක ගාස්තු ලෙස ගෙවා ඇති මුදල කොපමණද;

(v) ගාලු වරාය අඛණ්ඩව පාඩු ලබමින් තිබෙන බව දන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4808/'14

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම දිස්ත්‍රික්කයේ පෙරියමඩු කෘෂි කාර්මික ගම්මානයේ කෙසෙල්, පොල් හා වෙනත් බෝග වගාවන්ට වන අලි ප්‍රහාර හේතුවෙන් හානි සිදුවන බවත්;

(ii) එම ගම්මානයේ ජනතාව වන අලි ප්‍රහාර හේතුවෙන් බියෙන් ජීවත්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) පෙරියමඩු ගම්වාසීන්ට වන අලි ප්‍රහාර නිසා මුහුණපෑමට සිදුවී ඇති භයානක තත්ත්වය නැති කිරීමට අවශ්‍ය කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4868/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 වර්ෂයේ දී පැවති පොදු රාජ්‍ය මණ්ඩලීය නායක සමුළුව සඳහා ආනයනය කළ බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(iii) මේ වන විට එම බස් රථ තිබෙන ස්ථානය කවරේද;

(iv) එම බස් රථ නඩත්තුව සඳහා රජය මාසිකව වැය කරන මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් බස් රථ සියල්ලම මේ වන විටත් රජය සතුව පවතින්නේද;

(ii) නොඑසේ නම්, එම බස් රථ විකුණනු ලැබුවේද;

(iii) එසේ නම්, එකී බස් රථ අලෙවිකිරීමෙන් භාණ්ඩාගාරයට ලැබුණු මුදල කොපමණද;

(iv) එම බස් රථ අලෙවියෙන් භාණ්ඩාගාරයට අහිමි වූ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2668/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් පරිදි නැගෙනහිර නවෝදය යටතේ ක්‍රියාත්මක කළ ගෙවතු වගා 2500 ක් සහ පළතුරු ගම්මාන 19 ක් බිහිකිරීමේ වැඩසටහන තවදුරටත් ව්‍යාප්ත කර තිබේද;

(ii) එසේ නම්, එම වැඩසටහන යටතේ නැගෙනහිර පළාතේ මේ වන විට ආරම්භ කර ඇති සම්පූර්ණ ගෙවතු වගා සංඛ්‍යාව සහ පළතුරු ගම්මාන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මහින්ද චින්තනය අනුව ඉහත වැඩසටහන යටතේ ආරම්භ කළ ගෙවතු වගා සහ පළතුරු ගම්මානවල නිෂ්පාදන අලෙවි කිරීමට නවවෙළඳ ක්‍රමයක් හඳුන්වා දී තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රමයට අදාළ විස්තර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3245/'12

ගරු රවී කරුණානායක මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) තැපැල් දෙපාර්තමේන්තුවට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට තිබෙන ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකුට දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3741/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කය තුළ මේ වන විට ඇති ජාතික පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල සේවය කරනු ලබන මුළු ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ගුරු පිරිසගෙන් වර්ෂ 5-10, 11-15, 16-20 සහ 21 ට වැඩි වශයෙන් තම සේවා කාලය තත් පාසල තුළ සපුරා ඇති ගුරුවරුන් සංඛ්‍යාව එක් එක් පාසල අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මාතර දිස්ත්‍රික්කයේ එක් එක් ජාතික පාසල තුළ දීර්ඝ කාල සීමාවක් තිස්සේ සේවය කරනු ලබන විශාල ගුරු පිරිසක් සිටින බව පිළිගන්නේද;

(ii) එම ගුරුවරුන් එකම පාසලේ රැඳී සිටීමට හේතු කවරේද;

(iii) එම ගුරුවරුන් සඳහා ස්ථාන මාරුවීම් ලබාදීමට විධිමත් වැඩපිළිවෙළක් කඩිනමින් සකස් කරන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4174/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2013 ජුලි මාසය අවසන් වන විට රාජ්‍ය විශ්වවිද්‍යාලවල සේවයේ නියුතුව සිටි එක් එක් අනධ්‍යයන කාර්ය මණ්ඩලවලට අයත් සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩල සේවකයින්ගේ බඳවා ගැනීම්වලට අදාළ අවම වැටුප් ප්‍රමාණය කවරේද;

(iii) එම අනධ්‍යයන සේවකයින්ගේ වැටුප් වර්ධක නිර්මාණය වී ඇති ආකාරය කවරේද;

(iv) අනධ්‍යයන සේවකයින්ගේ විවිධ වැටුප් තලයන්ට අදාළ දීමනා කවරේද;

(v) මේ වන විට අනධ්‍යයන කාර්ය මණ්ඩලයන්හි පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2014 ජූලි මස 11 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2665/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් වන පරිදි පන්සල්, කෝවිල්, පල්ලි හා මුස්ලිම් දේවස්ථාන ඇතුළු ආගමික සිද්ධස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා සකස් කර ඇති රජයේ ආධාර වැඩසටහන් කවරේද;

(ii) එම ආධාර වැඩසටහන්වලට අදාළ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3246/'12

ගරු රවී කරුණානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට තිබෙන ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකුට දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3268/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයිනේ සෑම ග්‍රාම නිලධාරී වසමක් සඳහාම ''සේවා පියස'' කාර්යාලය බැගින් ඉදිකිරීමට පියවර ගෙන තිබේද;

(ii) ඒ සඳහා වෙන් කොට ඇති මුදල කොපමණද;

(iii) ''සේවා පියස'' එක් කාර්යාලයක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු කළ මුදල කොපමණද;

(iv) ''සේවා පියස'' පළමු කාර්යාලය ඉදිකරනු ලබන්නේ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3713/'13

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010, 2011 සහ 2012 වර්ෂවලදී ජනාධිපති අරමුදලට ලැබුණු මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම මුදල් සම්පාදනය කරගත් ආකාරය කවරේද;

යන්න වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ජනාධිපති අරමුදලින් පසුගිය වර්ෂ දෙක තුළ දී වැය කරනු ලැබූ සමස්ත මුදල;

(ii) එක් එක් ක්ෂේත්‍රය අනුව වැය කළ මුදල;

කොපමණද යන්නත් වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ජනාධිපති අරමුදලින් වෛද්‍ය ප්‍රතිකාර සඳහා ආධාර ලබා දීම සඳහා පුද්ගලයින් තෝරා ගැනීම සිදුකරන පදනම කවරේද;

(ii) පසුගිය වර්ෂ 03ක කාලය තුළ ප්‍රාදේශීය සභා, පළාත් සභා සහ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරුන් වෙනුවෙන් වෛද්‍ය ප්‍රතිකාර සඳහා ජනාධිපති අරමුදලින් ආධාර ලබා දී තිබේද;

(iii) එසේ නම්, ඔවුන්ගේ නම් සහ එක් එක් තැනැත්තාට ලබා දුන් මුදල් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3829/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ, කන්තලේ වන රක්ෂිතය සහ නාවික හමුදා වැඩබිම පිහිටි අභයභූමිය තුළ අනවසර හා නීති විරෝධී ගල්කොරි 30ක් පමණ පවත්වාගෙන යනු ලබන බවත්;

(ii) දැනට තාවකාලිකව නවතා දමා ඇති තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, ගල්මැටියාව ග්‍රාම නිලධාරී වසමේ, කන්තලේ වන රක්ෂිතය තුළ පිහිටි මහා පරිමාණ ගල්කොරිය නැවතත් ආරම්භ කිරීමට සැලසුම් කර ඇති බවත්;

(iii) ඒ සඳහා අවසර ලබාදෙන ලෙසට ප්‍රදේශයේ ප්‍රබල දේශපාලනඥවරියක් රජයේ නිලධාරීන්ට දැඩි බලපෑම් කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත උල්ලංඝනය කරමින් වනාන්තර එළිපෙහෙළි කර ගල්කොරි පවත්වාගෙන යාම නීති විරෝධී ක්‍රියාවක් මෙන්ම පරිසරයට දැඩි හානි ගෙනදෙන ක්‍රියාවක් බව පිළිගන්නේද;

(ii) එසේ නම්, මෙම නීති විරෝධී ක්‍රියාවන් නවතාලීම සඳහා කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3925/'13

ගරු සුජීව සේනසිංහ මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) විදේශ රැකියා ඒජන්සි ආයතන විශාල සංඛ්‍යාවක් මගින් වැඩි වැටුප් ලැබෙන නිශ්චිත රැකියා සඳහා යොමු කරන බව පවසමින් විදේශගත කරනු ලබන ශ්‍රමිකයන් විදේශයන්හිදී අඩු වැටුප් ලබන රැකියාවල යොදවනු ලබන බව එතුමා දන්නෙහිද?

(ආ) ව්‍යාජ තොරතුරු සපයා ශ්‍රමිකයින් විදේශගත කරන රැකියා ඒජන්සි කරුවන්ට එරෙහිව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ගෙන ඇති නීතිමය පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4444/'13

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂ හතක කාල සීමාව තුළ ලංකා විදුලිබල මණ්ඩලයේ සේවය සඳහා කොන්ත්‍රාත් පදනම මත හෝ අනියම් සේවක පදනම මත බඳවාගෙන ඇති සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවකයින් අතරින් වර්ෂ පහකට වැඩි කාලයක් සේවය කර ඇති සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) එකී සේවකයින් සඳහා කරනු ලබන ගෙවීම් කම්කරු රෙගුලාසිවලට අනුවම සිදු කර තිබේද;

(iv) එසේ නම්, එපරිදි කටයුතු කිරීම ආරම්භ කළ දිනය කවරේද;

(v) ඉහත (i) හි සඳහන් සේවක සංඛ්‍යාව අතරින් ලංකා විදුලිබල මණ්ඩලයේ ස්ථිර සේවය සඳහා බඳවාගෙන ඇති සංඛ්‍යාව කොපමණද;

(vi) එම බඳවා ගැනීම් කවර කාර්ය පටිපාටියක් යටතේ සිදුකර තිබේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4475/'13

ගරු තිස්ස අත්තනායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මන්නාරම දිස්ත්‍රික්කයේ සමස්ත භූමි ප්‍රදේශයේම බිම් බෝම්බ හෝ පුපුරණ ද්‍රව්‍ය ඉවත් කොට සාමාන්‍ය ජනතාවට ජීවත්වීමට අවශ්‍ය වටපිටාව සකස් කර දී තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මන්නාරම දිස්ත්‍රික්කයේ, මඩු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉරණෛයි ඉලුප්පායකුලම් ප්‍රදේශයේ එම්. කේ. යසවතී මහත්මිය සතු අක්කර 20 ක පමණ භූමියක පිහිටුවා තිබූ යුද හමුදා කඳවුර එම ස්ථානයෙන් ඉවත් කල පසු එම භූමියේ බිම් බෝම්බ හෝ පුපුරණ ද්‍රව්‍ය ඉවත් කොට ශුද්ධ පවිත්‍ර කර දී නොමැති බවත්;

(ii) එම හේතුවෙන් අදාළ ඉඩම් හිමිකරුවන් වගා කටයුතු සිදුකිරීමට නොහැකිව දැඩි අපහසුතාවකට පත්වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, ඉහත සඳහන් ඉඩමේ හිමිකරුවන් හට තම වගා කටයුතු කරගෙන යැමට හැකි වන පරිදි එම වගා බිම් ශුද්ධ පවිත්‍ර කරදීමට ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4754/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයින තුළ ඇති පොල් තෙල් කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින එම කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(iii) 2005 වර්ෂයේ දී කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වූ පොල් කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(iv) කුරුණෑගල දිස්ත්‍රික්කයේ දැනට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින පොල් කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(v) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පමණක් පොල් කර්මාන්ත ශාලා 80 ක් පමණ වැසී ගොස් ඇති බව දන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4798/'14

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) නොරොච්චෝලේ ගල් අඟුරු තාප බලාගාරයේ විදුලි උත්පාදනය ආරම්භ කළ දින සිට මේ දක්වා එය අක්‍රිය වූ වාර ගණන සහ එක් එක් අවස්ථාවේදී අක්‍රියව තිබූ කාල සීමාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මේ දක්වා එය අක්‍රිය වූ අවස්ථාවන්හිදී එහි අලුත්වැඩියා කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද;

(iii) එම අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් වැය වූ මුදල බලාගාරය අක්‍රිය වූ එක් එක් අවස්ථාව අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම අක්‍රියවීම් අදාළ උපකරණවල වගකීම් කාලය තුළ සිදු වූයේ නම්, ඉහත පරිදි මුදල් වැය කිරීමට හේතු කවරේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නොරොච්චෝලේ තාප විදුලි බලාගාරයේ සිදුවූ අක්‍රියවීම් හේතුවෙන් එම කාල සීමාවන් තුළ වෙනත් බලාගාර ඔස්සේ ජාතික විදුලිබල පද්ධතියට විදුලිය එක් කිරීම සඳහා වැය කළ අතිරේක මුදල කොපමණද;

(ii) ඉහත තාප විදුලි බලාගාරයේ බිඳ වැටීම් හේතුවෙන් වැය වූ අතිරේක මුදල එකතු කළ විට විදුලි ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා කොපමණ මුදලක් වැය වී තිබේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2670/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ කරදිය ධීවර කර්මාන්තය නංවාලීම උදෙසා ක්‍රියාත්මක කර ඇති ජාතික වැඩපිළිවෙළ කවරේද;

(ii) කරදිය ධීවර ප්‍රජාවට ධීවර කාර්මික උපකරණ ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක වන්නේද;

(iii) එසේ නම්, එම වැඩසටහන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම වැඩසටහන් සඳහා වෙන් කර ඇති මුළු මුදල කොපමණද;

(v) එම මුදල ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයට වෙන් කළ මුළු මුදලේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(vi) වෙන් කරන ලද එම මුදල ප්‍රමාණවත්වේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3247/'12

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට තිබෙන ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකුට දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3330/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2008-2012 කාල සීමාව තුළ,

(i) ස්ත්‍රී දූෂණ සම්බන්ධයෙන් වරදකරුවන් බවට පත්වී ඇති සංඛ්‍යාව කොපමණද;

(ii) ස්ත්‍රී ඝාතන සම්බන්ධයෙන් වරදකරුවන් බවට පත්වී ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත කාල සීමාව තුළ ස්ත්‍රී දූෂණ හා ස්ත්‍රී ඝාතනවලට අදාළව වරදකරුවන් බවට පත්වූ, දේශපාලනයට සම්බන්ධ පුද්ගලයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම වරදකරුවන් වෙත ලබා දී ඇති දඬුවම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3720/'13

ගරු අනුර දිසානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂ පහ තුළ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා ආනයනය කරන ලද දුම්රිය එන්ජින් හා මැදිරි සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා මිලදී ගනු ලැබූ රට හෝ රටවල් කවරේද;

(iii) මිලදී ගැනීමේදී අනුගමනය කරන ලද පටිපාටිය කවරේද;

(iv) ඒවා මිලදී ගැනීම සඳහා මුදල් සම්පාදනය කරගත් ආකාරය කවරේද;

(v) මුදල් සම්පාදනය වෙනුවෙන් දේශීය හෝ විදේශීය ණය ලබාගෙන තිබේද;

(vi) එසේ නම්, එම ණය ප්‍රමාණයන්, පොලී අනුපාතිකයන් සහ අදාළ කොන්දේසි කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ආනයනය කරන ලද ඉහත සඳහන් එන්ජින් හා මැදිරිවල අවශ්‍ය තාක්ෂණය නොමැති බව හෙළිවී තිබේද;

(ii) ඒ සඳහා බලපෑ ඇති හේතු කවරේද;

(iii) එම තාක්ෂණික දෝෂ සහිත දුම්රිය මැදිරි හා එන්ජින් මිලදී ගැනීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා තිබේද;

(iv) එසේ නම්, එම පරීක්ෂණ අනුව ඉහත මිලදී ගැනීම් සඳහා වගකිව යුතු අය කවුරුන්ද;

(v) ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3830/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හක්මණ - මාතර මාර්ගය පුළුල් කර කාපට් කිරීම සඳහා කටයුතු කරන්නේද;

(ii) එම මාර්ගය පුළුල් කර සංවර්ධනය කිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iii) ඒ සඳහා අරමුදල් සපයා ගන්නා මූලාශ්‍ර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මාතර දිස්ත්‍රික්කය තුළ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) මාතර - හක්මණ මාර්ගය, ගොඩගම - බෙලිඅත්ත අධිවේගී පිවිසුම් මාර්ගය යැයි පවසමින් පුළුල් කරන බව දන්නේද;

(iii) එම මාර්ගය පුළුල් කර සංවර්ධනය කරන්නේ නම්, මීට වඩා වැඩි ප්‍රදේශයක් ආවරණය වන ගොඩගම අකුරැස්ස මාර්ගයද සංවර්ධනය නොකිරීමට හේතු කවරේද;

(iv) මීට වර්ෂ 7-8 කට පෙරද කාපට් කරන ලද එම මාර්ගය, මාර්ග සංවර්ධන අධිකාරියේ ඉහළ නිලධාරීන්ගේ වැරදි වාර්තා පදනම් කරගෙන නැවතත් පුළුල් කිරීමට කටයුතු කරන බව දන්නේද;

(v) කාපට් කරන ලද මාර්ගයක් නැවත කාපට් කිරීමට කටයුතු කිරීම මුදල් නාස්ති කිරීමක් නොවන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 18/'10

ගරු රවී කරුණානායක මහතා,— "විශේෂ නඩු පවරන නිලධාරී" නමැති තනතුරක් ඇති කිරීම,— රාජ්‍ය සේවය දේශපාලන බලපෑම් වලින් තොර බවට සහතික කරනු වස්, ආයතනවල ගුණාත්මකභාවයට බලපාන ලෙස සිදු කළ අයථා පරිහරණයන්, දූෂණයන් හෝ අකාර්යක්ෂමතාවයන් පිළිබඳ සිද්ධීන්, ස්වාධීන කොමිසම්, රාජ්‍ය ගිණුම් කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මගින් වාර්තා කළ වහාම ඒ සම්බන්ධ පැමිණිලි මෙහෙයවන, පාර්ලිමේන්තුවට සෘජුවම වාර්තා කරනු ලබන තනතුරක්, "විශේෂ නඩු පවරන නිලධාරී" නමින් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/'10

ගරු රවී කරුණානායක මහතා,— උද්ධමනයට ගැලපෙන සේ සේවා නියුක්තිකයන්ට 1%ක දීමනාවක් ගෙවීම,— රාජ්‍ය ආයතන විසින් පරිපාලනය කරනු ලබන සේවා නියුක්තිකයන්ගේ අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල ගෙවීමේ දී එක් එක් වර්ෂයේ උද්ධමනය ප්‍රමාණයට වඩා 1%ක දීමනාවක් සේවා නියුක්තිකයන්ට ලබා දීමට සහතික විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/'10

ගරු රවී කරුණානායක මහතා,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට නොමිලේ ගමන් පහසුකම් සැලසීම,— සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට පොදු ගමනාගමන සේවාවන්වල නොමිලේ ගමන් පහසුකම් සලසා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/'10

ගරු රවී කරුණානායක මහතා,— අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටුවීම,— සාමය කඩවීම වැනි ජාතික ප්‍රශ්නයක් ඇති ශ්‍රී ලංකාව බහු ජාතික හා බහු ආගමික රටක් වන හෙයින්, ශ්‍රී ලංකාව තුළ, කලාපය තුළ හා සමස්ත වශයෙන් ලෝකයේම එවැනි ප්‍රශ්න විසඳීම සඳහා බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු හා ඉස්ලාම් ආගම්වල ශක්තිය ප්‍රයෝජනයට ගනිමින් අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටු විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 23/'10

ගරු රවී කරුණානායක මහතා,— විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව ලබාදීම,— මෙතෙක් විශ්‍රාමික පාරිතෝෂික මුදල් ලබා නොදුන් විශ්‍රාමිකයින්ට එම විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 24/'10

ගරු රවී කරුණානායක මහතා,— ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත් කිරීම,— ක්‍රමවත් ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් නිර්මාණය කිරීම සඳහා දේශපාලනඥයන්ගෙන් හා විෂය බද්ධ වෘත්තීයවේදීන්ගෙන් සමන්විත ආණ්ඩු මාරුවීම් අනුව වෙනස් නොවන නිශ්චිත බලයක් සහිතවූත් ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත්කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 25/'10

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියා නියුක්තිකයන්ගේ ගැටලු නිරාකරණය කිරීම සඳහා නීතිමය බලතල සහිත ඒකකයක් පිහිටුවීම,— විදේශ රැකියාවන්හි නියුක්ත වූවන්ට සිදුවන පහරදීම්, පැහැරගෙන යෑම්, ස්ත්‍රී දූෂණ, ලිංගික අපචාරයෙහි යෙදවීම්, මිනීමැරීම් හා විදේශගත වීමේදී සිදුවන මුදල් වංචා කිරීම් හා විදේශගත වී අනාථ වූවන් නැවත ගෙන්වා ගැනීම

හා ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳ සොයා බැලිය හැකි නීතිමය බලතල ඇති ඒකකයක් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 26/'10

ගරු රවී කරුණානායක මහතා,— නව නිපැයුම්කරුවන් ලෝකයට හඳුන්වා දීම සඳහා ජාතික වැඩපිළිවෙළක් සකස් කිරීම,— නව නිපැයුම්කරුවන් සහ විවිධ දක්ෂතා ඇති පුරවැසියන් ලෝකයට හඳුන්වාදීම සඳහා ද ඔවුන් සතු දක්ෂතා හා එකී නිර්මාණ දියුණු කර ගැනීම සඳහා ද ජාතික වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 27/'10

ගරු රවී කරුණානායක මහතා,— දේශීය අමු ද්‍රව්‍ය යොදා ගන්නා කර්මාන්තකරුවන්ට බදු සහන ලබා දීම,— සම්පූර්ණයෙන් ජාත්‍යන්තර වෙළෙඳපොළ සඳහා ඉලක්ක කර ගනිමින් 75% කට වඩා දේශීය අමුද්‍රව්‍ය යොදා ගනිමින් භාණ්ඩ නිපදවන දේශීය කර්මාන්තකරුවන්ට අවුරුදු 02ක බදු සහන කාලයක් ලබා යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 28/'10

ගරු රවී කරුණානායක මහතා,— වතුකර ජනතාවට පුරවැසිකම් ලබාදීම,— වතුකරයේ ශ්‍රී ලංකා පුරවැසිකම නොමැති සියලු ජන කොට්ඨාසවලට ඔවුන්ගේ කැමැත්ත මත පුරවැසිභාවය ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 29/'10

ගරු රවී කරුණානායක මහතා,— දිවයිනේ ප්‍රාථමික පාසල් දරුවන්ට නොමිලේ කිරි වීදුරුවක් ලබා දීම,— දිවයිනේ සියලු ප්‍රාථමික පාසල් දරුවන්ට උදෑසන නොමිලයේ කිරි වීදුරුවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 31/'10

ගරු රවී කරුණානායක මහතා,— පාසල් ළමුන් සඳහා නිදහස් වාර ගමන් ප්‍රවේශ පත්‍ර ලබා දීම,— පාසල් ළමුන්ට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ බස් රථවල ගමන් කිරීම සඳහා නිදහස් වාර ප්‍රවේශපත් ක්‍රමයක් හඳුන්වාදීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 32/'10

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා පාසල් ඉදිකිරීම හා ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීම,— දිගුකාලීන ඉලක්කයක් සහිත ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් හා වැඩපිළිවෙළක් සකස් කිරීම උදෙසා මූලික වශයෙන් සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි ක්‍රීඩාගාර, පිට්ටනි, උපකරණ හා ක්‍රීඩා උපදේශකයන්ගෙන් සමන්විත උසස් ගණයේ ක්‍රීඩා පාසල් ඉදිකිරීමටත් ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීමටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 33/'10

ගරු රවී කරුණානායක මහතා,— ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් පිහිටුවීම,— ගුරුවරුන්ට සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම සඳහා ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් ස්ථාපිත කිරීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 44/'10

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය තොරතුරු නිදහස්ව ලබා ගැනීම සඳහා නීති සම්පාදනය කිරීම,— රජයේ විනිවිදභාවය පවත්වා ගැනීම සඳහා ද, මහජනතාවට සියලු රාජ්‍ය තොරතුරු නිදහස්ව ලබා ගැනීමේ අයිතිය උදෙසා ද පාර්ලිමේන්තුව තුළ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.45/'10

ගරු රවි කරුණානායක මහතා,— ශ්‍රී ලාංකිකයින්ට වඩා යහපත් සෞඛ්‍ය අවස්ථාවන් සලසා දීම,— ජනතාවගෙන් විශාල පිරිසකට හදවත් සැත්කම් කිරීම අවශ්‍යව ඇති හෙයින්, ශ්‍රී ලාංකිකයන්ට වඩා හොඳ සෞඛ්‍ය අවස්ථාවන් සලසා දිය යුතු යැයි ද, ඒ සඳහා පෞද්ගලික අංශයේ සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදල හෝ සේවක භාරකාර අරමුදල හරහා නොමිලයේ පහසුකම් සලසා දිය යුතුයැයි ද, රජයේ සේවකයන් හෝ සේවා වියුක්තිකයන් සඳහා සම්පූර්ණ වියදම රජය විසින් ජනාධිපති අරමුදල හරහා සැපයිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.46/'10

ගරු රවි කරුණානායක මහතා,— ලෝක පරිසරය ආරක්ෂා කිරීම,— ශ්‍රී ලංකාව, ලෝක පරිසරය ආරක්ෂා කිරීම කෙරෙහි දැඩි අවධානය යොමු කළ යුතු අතරම ගෝලීය උණුසුම වැළැක්වීමට විශේෂයෙන් පියවර ගතයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.47/'10

ගරු රවි කරුණානායක මහතා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු විකාශනය කිරීම,— රූපවාහිනිය හෝ අන්තර්ජාලය හරහා පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු සජීවිව හෝ පරීක්ෂිතව විකාශනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.48/'10

ගරු රවි කරුණානායක මහතා,— එතෙර ජීවත් වන ශ්‍රී ලාංකිකයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමට අවසර දීම,— එතෙර ජීවත්වන ශ්‍රී ලාංකිකයන්ට ඉදිරි මැතිවරණ සඳහා ඡන්දය ප්‍රකාශ කිරීමට අවසර දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.49/'10

ගරු රවි කරුණානායක මහතා,— විද්‍යුත් ඡන්ද ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් හඳුන්වාදීම,— යල්පැන ගිය වර්තමාන ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමය වෙනුවට විද්‍යුත් ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.57/'10

ගරු රවි කරුණානායක මහතා,— ඡන්ද හිමි නාම ලේඛනය නිරතුරුව යාවත්කාලීන කිරීම,— ඡන්ද හිමි නාම ලේඛනය මුළු වර්ෂයෙන්ම දින තිහක කාලයක් සඳහා පමණක් යාවත්කාලීන වන ලයිස්තුවක් නොව නිරතුරුවම යාවත් කාලීන වන විවෘත ලැයිස්තුවක් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.59/'10

ගරු රවි කරුණානායක මහතා,— විදේශ රැකියාවල නියුතු අය සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබාදීම, —විදේශ ගතවී ඉතා අපහසුවෙන් උපයාගත් ධනය ශ්‍රී ලංකාවේ ධන සම්පත්තිය වැඩිකිරීම සඳහා එවන විදේශ රැකියාවල නියුතු අය ඇගයීම පිණිස විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබා දීම සඳහා පියවර ගතයුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.60/'10

ගරු රවි කරුණානායක මහතා,— 2009 මැයි 19 දිනට පෙර සේවයේ සිටි සන්නද්ධ සේනාවන් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම,—පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වසර පහක සේවා කාලය සම්පූර්ණවූ පසු විශ්‍රාම වැටුප් ලැබීමට සුදුසුකම් ලබන බැවින් සන්නද්ධ සේනාවන්වල අවුරුදු 22 ක කාලය සම්පූර්ණ නොකළද 2009 වර්ෂයේ මැයි 19 වන දිනට පෙර ක්‍රියාකාරී සේවයේ යෙදී සිටි යුධ සෙබළුන්ට ද විශ්‍රාම වැටුප් ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.62/'10

ගරු රවි කරුණානායක මහතා,— දුබල හා එහා මෙහා යා නොහැකි පුද්ගලයන් සඳහා විශේෂ සැලසුම් හඳුන්වාදීම,— නීතියේ සඳහන් වන පරිදි දුබල හා එහා මෙහා යා නොහැකි පුද්ගලයන්ගේ පහසුව තහවුරු කිරීමට හා ඔවුන් සතු ඵලදායීතාව වර්ධනය කිරීම සඳහාත් ඔවුන් අනවශ්‍ය ලෙස අනුන් මත යැපීම අවම කිරීම සඳහාත් සියලු නව රජයේ ගොඩනැගිලිවල විශේෂිත සැලසුම් ක්‍රමයක් ඇතිකළ යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.63/'10

ගරු රවි කරුණානායක මහතා,— ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය තහවුරු කිරීම,— ලියාපදිංචිවුවද ඡන්දය ප්‍රකාශකිරීමට අවස්ථාව නොලැබුනු ඡන්දදායකයන් බොහෝ සංඛ්‍යාවක් සිටින බැවින් වයස අවුරුදු 18 ට වැඩි සියලුම පුද්ගලයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ලබා දිය යුතු බව සහ ඡන්ද හිමි නාමලේඛනයේ නම සඳහන්වූ නමුත් ඡන්දය ප්‍රකාශ නොකරන පුද්ගලයන්ගෙන් දඩ මුදලක් අයකළ යුතුබව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.64/'10

ගරු රවි කරුණානායක මහතා,— දූෂණයෙන් තොර ලෝකයක් තහවුරු කිරීම— දූෂණය මුලින් උපුටා දැමීම සඳහා ලෝකයේ පාර්ලිමේන්තු සංවිධාන සමඟ එක්වී ශ්‍රී ලාංකික පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කටයුතු කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 69/'10

ගරු රවි කරුණානායක මහතා,— මුළාවට ලක්වූ තැන්පත්කරුවන්ට තම මුදල් නැවත ගෙවීම,— ව්‍යාජ මූල්‍ය ආයතනවල තම මුදල් තැන්පත්කර එමඟින් මුළාවට ලක්වූ බොහෝ දෙනෙක් සිටින බැවින් හා පසුගිය 2009/2010 මැතිවරණ ව්‍යාපාරයේදී මෙම රජය විසින් තැන්පත්කරුවන් සහ මූල්‍ය ආයතනවලට ඔවුන්ගේ හිඟ මුදල් නැවත ගෙවීමට පොරොන්දුවී ඇති බැවින්, මහ බැංකුව මෙම ආයතනවල භාරකරු හෙයින් වඩා කාර්යක්ෂම ලෙස කටයුතු කළ යුතු බවත්, තැන්පත්කරුවන්ට තම හිඟ මුදල ලබා දීමට රජය ඉදිරිපත් විය යුතු බවත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.80/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—සුනඛයින්, බළලුන් වැනි සුරතල් සතුන් ඇති කිරීම සම්බන්ධ නීති සම්පාදනය,— නිවෙස්වල හෝ අලෙවි කිරීම සඳහා ඇති කරන සුනඛයින්, බළලුන් වැනි සුරතල් සතුන් පළාත් පාලන ආයතනවල ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතු අතර, එම සතුන්ගේ පැටවුන් අලෙවි කිරීම නීත්‍යානුකූලව අවසර ලත් මධ්‍යස්ථානවලදී පමණක් සිදු කළ යුතු බවත්, එසේ නොවන ස්ථානවල ඇති කරන ගැහැණු සතුන් අනිවාර්යයෙන්ම වන්ද්‍යාකරණයට ලක් කිරීමටත්, අවශ්‍ය නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 81/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රැකියා වෙළඳපොළට අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීම,— අනාගත ශ්‍රී ලංකාවේ බිහිවන නව රැකියා අවස්ථා සඳහා අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීමේ ක්‍රමවේදයකට මුල පිරීමේ කාර්යය වඩාත් කාර්යක්ෂම ලෙස රට තුළ පවත්නා සියලුම තෘතීක අධ්‍යාපන ආයතන මගින් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 82/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරීම,— දැනට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් ග්‍රාම නිලධාරී වසම් යළි සීමා නිර්ණය කිරීම සඳහා කටයුතු කරගෙන යමින් සිටින බැවින් එසේ සීමා නිර්ණය කරනු ලබන ග්‍රාම නිලධාරී වසම් තුළින් නව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ සීමා සහ නව දිස්ත්‍රික් සීමා නිර්ණය කළ යුතු බවත්, මෙසේ නිර්ණය කරනු ලබන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය පළාත් පාලන ආයතන බල ප්‍රදේශය බවට

පත්කළ යුතු අතර එකී බල ප්‍රදේශයට කොට්ඨාස අධ්‍යාපන බල ප්‍රදේශය, පොලිස් බල ප්‍රදේශය, ගොවිජන සේවා බල ප්‍රදේශය, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා නිලධාරී බල ප්‍රදේශය ඇතුළු සියලු රාජ්‍ය ආයතනයන්හි බල ප්‍රදේශ සීමා සංයුක්ත වන පරිදි සමස්ත රාජ්‍ය ව්‍යුහයම ප්‍රතිසංවිධානය විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 83/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— නිල්වලා ගඟ ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධන කටයුතු යළි ආරම්භ කිරීම,— මාතර දිස්ත්‍රික්කයේ නිල්වලා ගඟ ව්‍යාපාරයේ සංවර්ධන කටයුතු අතර මග ඇන හිටීමෙන් එම මිටියාවතේ පෝෂක ප්‍රදේශයන්හි හව භෝග වගා කරන ජනතාවට මුහුණ පෑමට සිදුවී ඇති ගැටලු කඩිනමින් විසඳීමට පියවර ගත යුතු බවත්, නිල්වලා ගඟ ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධන කටයුතු කඩිනමින් යළි ආරම්භ කළ යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 84/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින්ගේ නිල කාලයට පසුද සාමවිනිසුරු පදවිය ලබාදීම,— පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින්ට දෙනු ලබන සාමවිනිසුරු තනතුරු ඔවුන්ගේ නිල කාලයට පමණක් සීමාවන බැවින්, නිල කාලයෙන් පසුවත් ඔවුන්ගෙන් එම සේවාව ලබා ගැනීම සඳහා පැමිණෙන විශාල පිරිසක් අපහසුතාවයට පත්වන බැවින්, එම මහජන නියෝජිතයන්ට තම නිල කාලයෙන් පසුවත්, සාම විනිසුරු තනතුරු ලබා දීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 85/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලුම පළාත් සභා ජනතා නියෝජිතයන්ගේ දීමනා හා වරප්‍රසාද පිළිබඳව නැවත සලකා බැලීම,— දිවයිනේ දැනට ක්‍රියාත්මක වන පළාත් සභා හා ඉදිරියේදී විධිමත්ව ක්‍රියාත්මකවීමට නියමිත උතුරු පළාත් සභාවේ ගරු අමාත්‍යවරුන්, සභාපතිවරුන්, උපසභාපතිවරුන්, ආණ්ඩු පාර්ශ්වයේ සංවිධායකවරුන්, සභා නායකවරුන්, විරුද්ධ පාර්ශ්වයේ නායකවරුන්, විරුද්ධ පාර්ශවයේ ප්‍රධාන සංවිධායකවරුන් සහ ගරු මන්ත්‍රීවරුන්ගේ දීමනා, වරප්‍රසාද හා පහසුකම් ක්‍රමවත් තත්වයක නොපවතින බැවින් මේ පිළිබඳව ගැඹුරින් සලකා බලා ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 86/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන ආයතන වල සියලුම මහජන නියෝජිතයින්ගේ දීමනා හා වරප්‍රසාද පිළිබඳ නැවත සලකා බැලීම,—දිවයිනේ ක්‍රියාත්මක වන හා ඉදිරියේදී ක්‍රියාත්මකවීමට නියමිත සියලුම මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභාවන්හි පුරපතිවරයන්, නගරාධිපතිවරයන්, සභාපතිවරයන්, නියෝජ්‍ය පුරපතිවරයන්, නියෝජ්‍ය නගරාධිපතිවරයන්, උප සභාපතිවරුන්, විපක්ෂනායකවරයන් හා මන්ත්‍රීවරයන්ගේ දීමනා, වරප්‍රසාද සහ අනෙකුත් පහසුකම් ක්‍රමවත් තත්වයක නොපවතින බැවින් මේ පිළිබඳව ගැඹුරින් සලකා බලා ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.87/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— උතුරු නැගෙනහිර අතුරුදහන් වූ දෙමළ ජනතාවට මරණ සහතික ලබා දීම,— උතුරු නැගෙනහිර ප්‍රදේශවල යුද්ධය පැවති පසුගිය දශක තුනක පමණ කාලය තුළ විවිධ හේතූන් නිසා අතුරුදහන් වී ඇති පුද්ගලයන් මේ වන විට ජීවතුන් අතර සිටී ද නැද්ද යන්න කඩිනමින් පරීක්ෂණ පවත්වා ඔවුන් ජීවතුන් අතර නොමැති නම් ඔවුන් සඳහා මරණ සහතික ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 88/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම,— සියලුම දේශපාලන පක්ෂ නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත විශේෂ කාරක සභාවක් පත්කොට ශ්‍රී ලංකාවට යෝග්‍යවූ ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම ආරම්භ කළ යුතුයැයි ද, ඒ සඳහා ඒ හා සබැඳි සියලු ක්ෂේත්‍රයන් නියෝජනය වන පරිදි ප්‍රවීණයන්, උගතුන් හා බුද්ධිමතුන්ගෙන් මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි සහාය ලබා ගත යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 89/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රජයේ පාසල් හා විශ්වවිද්‍යාල නිවාඩු දිනවලදී එම මධ්‍යස්ථාන අධ්‍යාපන ඒකක සඳහා ලබාදීම,—රජයේ පාසල් නිවාඩු කාලයේදී සහ සවස් වරුවලත් විශ්වවිද්‍යාල නිවාඩු දිනවලත් එම මධ්‍යස්ථාන මුල් කොට ගෙන ව්‍යාපාරික ප්‍රජාව, රාජ්‍ය නොවන සංවිධාන, වාණිජ මණ්ඩල, ප්‍රජා මූල සංවිධාන සම්බන්ධ කර ගන්නා වූ පුළුල් වැඩපිළිවෙළක් වශයෙන් වැඩිහිටි හා නොවිධිමත් අධ්‍යාපන ඒකක සහනදායී ගාස්තු පදනමක් මත ආරම්භකළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 90/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පුරප්පාඩු වන ග්‍රාම නිලධාරී තනතුරු වල වැඩ බැලීමේ පත්වීම් සඳහා කාර්යක්ෂම වැඩපිළිවෙළක් සකස් කිරීම,— ග්‍රාම නිලධාරී තනතුරක පුරප්පාඩු ඇති වූ විට ආසන්න ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරීවරයා වැඩ බැලීම සඳහා පත් කරනු ලබන්නේ ඉතා සුළු දීමනාවක් යටතේ බැවින් ද, මෙම වැඩ බැලීමේ පත්වීම් තුළින් ග්‍රාම නිලධාරී වසම් දෙකෙහිම කාර්යක්ෂමතාව බිඳ වැටෙන බැවින්ද, එම තත්වය මග හරවා ගැනීම සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ග්‍රාම නිලධාරී සංචිතයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ පිහිටුවිය යුතු අතර පුරප්පාඩු සිදුවන වසම සඳහා එකී සංචිතය තුළින් ග්‍රාම නිලධාරීන් පත් කිරීම සහ එම සංචිතය තුළ සිටින ග්‍රාම නිලධාරීන්ට ප්‍රාදේශීය ලේකම් විසින් පවරනු ලබන වෙනත් ඵලදායී ක්ෂේත්‍ර හෝ රාජකාරී සඳහා යෙදවීමේ වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 91/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— වර්තමානයේ ක්‍රියාත්මක වන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දීම,— සෑම ග්‍රාම නිලධාරී වසමකම පිහිටා ඇති ආගමික සිද්ධස්ථානයන්හි නායක ස්වාමීන්වහන්සේ, පූජකතුමා, විදුහල්පතිතුමා, ග්‍රාම නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම පර්යේෂණ සහකාරවරයා, ජන සභා ලේකම්වරු, ප්‍රදේශයේ පොලිස් ස්ථානය නියෝජනය කරන නිලධාරියකු සහ එම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ස්වේච්ඡා සංවිධාන, රාජ්‍ය හා පෞද්ගලික අංශ වල සේවය කරන අදාළ වසමේ පදිංචිව සිටින නියෝජිතයින්ගෙන් සමන්විත සිවිල් ආරක්ෂක කමිටු ගොඩනැගීමට වඩාත් පහසුවීම සඳහා වර්තමාන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දිය හැකි පරිදි පාර්ලිමේන්තු පනතක් සම්මත කළ යුතු යැයි ද, ඒ තුළින් ග්‍රාම නිලධාරී වසම තුළ සිදුවන අපරාධ හා දූරාචාර, නීති විරෝධී කටයුතු පිළිබඳ අදාළ අංශ සමඟ මනා සම්බන්ධීකරණයක් ගොඩනැගීමට හැකි වන පරිදි අදාළ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 92/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— දිවයින තුළ දැනට ක්‍රියාත්මක වන යල් පැන ගිය නීති අණපනත් යාවත්කාලීන කිරීම,— ශ්‍රී ලංකාවේ මේ වනවිටත් අධිරාජ්‍යවාදී යුගයේදී හඳුන්වාදෙන ලද නීති අණපනත් ක්‍රියාත්මකවන බැවින් එම නීති අණපනත් යළි අධ්‍යනය කිරීමේ කමිටු පත්කර, යල් පැනගිය දඬුවම්, දඩ මුදල් ආදිය යාවත්කාලීන කිරීමේ ජාතික වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 93/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලු මැතිවරණ එකම දිනක පැවැත්වීම,— ශ්‍රී ලංකාව තුළ 1988 සිට 2010 දක්වා වසර 22 ක කාලය තුළ 1990, 1992, 1995, 1996, 1998, 2003 සහ 2007 වසරවලදී හැර අන් සෑම වසරකදීම කිසියම් මැතිවරණයක් පවත්වා ඇති අතර, එසේ මැතිවරණ පැවැත්වීම ජනතා මතය සලකා බැලීම සඳහා වටිනා නිර්ණායකයක් වුවද, මේ තුළින් රටේ ආර්ථිකය, පරිපාලනය ආදි සෑම ක්ෂේත්‍රයකටම දැඩි බලපෑමක් ඇති කරන බැවින් පළාත් පාලන මැතිවරණ, මහා මැතිවරණ සහ ජනාධිපතිවරණය එකම දිනයකදී පැවැත්වීමට හැකි වන පරිදි එකී ආයතනවල නිල කාලය සංශෝධනය කිරීමටත්, ගැලපෙන මැතිවරණ ක්‍රමවේදයක් නිර්මාණය කිරීමටත් සුදුසු පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 94/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම,— රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව පාර්ලිමේන්තුව හා පළාත් සභා අතරත්, පළාත් සභා හා පළාත් පාලන ආයතන අතරත් මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම අත්‍යාවශ්‍ය වන අතර ඒ සඳහා පළාත් පාලන ආයතන ප්‍රධානීන්, පළාත් සභා තුළ නියෝජනයවීම සහතිකවනු පිණිස ද, පළාත් සභා ප්‍රධානීන් පාර්ලිමේන්තුව තුළ නියෝජනය වීම සහතිකවනු පිණිසද ක්‍රමවේදයක් සකස් කිරීමට අවශ්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 95/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ඒකාග්‍රතාව ඇති කිරීමට පියවර ගැනීම,— ජාතික ඒකාග්‍රතාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දෙමළ භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල සිංහල භාෂා පුහුණු වැඩසටහන් ද, සිංහල භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල දෙමළ භාෂා පුහුණු වැඩසටහන් ද, රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික ආයතනයන්හි සහයෙන් ක්‍රියාත්මක විය යුතු අතර රාජ්‍ය හා පෞද්ගලික විද්‍යුත් මෙන්ම මුද්‍රිත මාධ්‍ය ආයතනවල සහයෝගය ලබාගනිමින් මෙම පුහුණු වැඩසටහන් ආරම්භ කිරීම සඳහා ජාතික වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 96/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— කලත්‍රයාගේ නොමනා ක්‍රියා නිසා අසරණභාවයට පත්වන පාර්ශවයට සහන සලසා දීම,— විවාහක අඹුසැමි යුවලක් එකම වහලක් යට ජීවත්ව සිටින අවස්ථාවලදී පුරුෂයා හෝ බිරිඳ සුරාව, සූදුව සහ වෙනත් අපචාරී කටයුතුවල යෙදෙමින් ඉඩම් හෝ ගේ දොර බඩු මුට්ටු තම පෞද්ගලික අභිමතය පරිදි විකුණමින් හෝ අන් අයට පවරමින් හැසිරීම නිසාවෙන් අනෙක් පාර්ශවයත් සමඟ දරුවන් දැඩි අසරණභාවයට පත් වන අවස්ථාවලදී එම තත්වය වළක්වා ගැනීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 98/’10

ගරු බුද්ධික පතිරණ මහතා,—චර්යා ධර්ම පිළිබඳ කාරක සභා ඇතිකිරීම,— ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්වාසවන්තභාවය හා ඔවුන් තුළ උසස් ආචාර ධර්ම පවත්වාගෙන යාමේ අවශ්‍යතාව නිසා ඒ පිළිබඳ කරුණු සොයා බැලීම සඳහා චර්යා ධර්ම පිළිබඳ කාරක සභාවක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 99/’10

ගරු බුද්ධික පතිරණ මහතා,—නව ඉලෙක්ට්‍රොනික් හැඳුනුම්පතක් නිකුත් කිරීම,— පරිපාලනය පහසු කිරීම, අපරාධ මැඩලීම සඳහා හා වෙනත් වංචනික ක්‍රියාවලට යොමුවීම අවමකිරීම සඳහා අදාළ පුද්ගලයාගේ රුධිර ගණය, බැංකු ගිණුම්, ක්‍රෙඩිට් කාඩ්, අධ්‍යාපන සුදුසුකම්, රියදුරු බලපත්‍ර හා විදේශ ගමන් බලපත්‍ර අංක ආදී වැදගත් හා අවශ්‍ය තොරතුරු

ඇතුළත් නව ඉලෙක්ට්‍රොනික අංකයක් සහිත ජාතික හැඳුනුම්පතක් නිකුත් කළ යුතු බවත් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයන්හි ජීවත්වන සියලු දෙනාගේ තොරතුරු ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් පරිගණකගත කිරීම කඩිනමින් කළ යුතු බවත් එම තොරතුරු වරින්වර යාවත්කාලීන කළයුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 100/'10

ගරු බුද්ධික පතිරණ මහතා, — පොලිස් නිලධාරීන්ට ද අවුරුදු විස්සක සේවා කාලයකින් පසු විශ්‍රාම යාමට අවස්ථාව ලබාදීම, — පොලිස් දෙපාර්තුමේන්තුවේ කාන්තා පොලිස් නිලධාරිනියන් සඳහා වන විසි වසරක සේවා කාලයකින් පසු ස්ව කැමැත්තෙන් විශ්‍රාමයාමේ හැකියාව, පොලිස් නිලධාරීන් සඳහා ද අදාළ වියයුතු යැයි ද ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 101/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කිරීම,—රෙගුලාසි තැනීම මෙන්ම රෙගුලාසි ඉවත් කිරීමද නිතර සිදුවන ක්‍රියාවලියක් බැවින් කල්පැන ගිය රෙගුලාසි ඉවත් කිරීම පිළිබඳ සොයා බැලීම සඳහා රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 102/'10

ගරු බුද්ධික පතිරණ මහතා, — සිවිල් ආරක්ෂක බලකායට අයත් නිලධාරීන්/ නිලධාරිනියන් සේවයේ ස්ථිර කිරීම, — සිවිල් ආරක්ෂක බලකායට අයත් නිලධාරීන් හා නිලධාරිනියන් සඳහා ද රජයේ අනෙකුත් ආරක්ෂක අංශවල සේවයේ නියුතු නිලධාරීන් හා නිලධාරිනියන්ට මෙන් වැටුප්, දීමනා, ස්ථිර සේවය සහ විශ්‍රාම වැටුප් සහිත රජයේ වෙනත් දෙපාර්තුමේන්තුවල මෙන් පිළිගත් නිල තත්ත්වයක් ලබාදිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 103/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—සහතික වීම පිළිබඳ කාරක සභා ඇති කිරීම,—පාර්ලිමේන්තුවේ අසන ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් රජය දෙන සහතික හා රජයේ බැඳීම් ඇතැම් විට කඩ වන අවස්ථා දක්නට ලැබෙන බැවින්, රජය සිය වගකීම් ඉටු කරන බවට සහ ඒවා පිළිබඳව වගකියන බවට සහතික වීම සඳහා සහතික වීම පිළිබඳ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 105/'10

ගරු බුද්ධික පතිරණ මහතා, — දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඵලදායීතාව වැඩිකර ගැනීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඇති අනවසර ඉදිකිරීම් හා අනවසර පදිංචිකරුවන් කඩිනමින් ඉවත්කර නීත්‍යානුකූල ඉදිකිරීම් සම්බන්ධ ගිවිසුම් නැවත සමාලෝචනය කිරීමෙන් දෙපාර්තමේන්තුවට ලැබෙන ආදායම් වර්ධනය කළ යුතු අතර, දෙපාර්තමේන්තුවේ සංවර්ධන කටයුතු සඳහා ඍජුවම බල නොපාන්නා වූ ඉඩම් දිගුකාලීන බදු පදනමක් මත පෞද්ගලික අංශයට ලබාදී එම මුදල් දුම්රිය පද්ධතිය නවීකරණය සඳහා යොදා ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.108/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— යාචකයින්ගේ ජීවිත ආරක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— මේ වන විට යාචකයින්ගේ ජීවිතවලට විශාල ලෙස තර්ජන එල්ල වී තිබෙන බැවින් ඔවුන්ගේ ජීවිතවල සුරක්ෂිතතාව රැකදීම උදෙසා, ඔවුන්ට වගා කිරීම සඳහා ඉඩම් ලබා දී ඉන් ලැබෙන ආදායමෙන් ඔවුන්ගේ ජීවිතවල ආරක්ෂාව හා පෝෂණය සහතික කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.109/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීමේ අරමුණින්, රජය මගින් භූමි ප්‍රමාණයක් වෙන්කොට එම ස්ථානයට නිදැල්ලේ යන සුනඛයින් ගෙන ගොස් ඔවුන් රැක බලාගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.110/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ළමා අපචාර සිද්ධීන් සඳහා දැඩි දඬුවම් පැනවීම,— දිවයින පුරා ළමා අපචාර හා අපයෝජනයන් දිනෙන් දින සීඝ්‍රයෙන් වර්ධනය වීමේ තත්ත්වයක් ඇති වී තිබෙන බැවින් ඒ සම්බන්ධව දැනට පවත්නා නීති රෙගුලාසි ප්‍රමාණවත් නොවන්නේ නම්, නව නීති රෙගුලාසි අලුතින් සම්මත කොට ඉතා කඩිනමින් මේ සම්බන්ධ නඩු විසඳීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.111/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා වෙරළ පිවිසුම් මාර්ග ඇති කිරීම,— දිවයිනේ වෙරළබඩ කලාපය තුළ සීඝ්‍රයෙන් සිදුවන ඉදිකිරීම් නිසාවෙන් දේශීය, විදේශීය සංචාරකයන්ට මෙන්ම ධීවරයන්ට ද වෙරළ තීරයට පිවිසීමේදී අවහිරතා ඇතිව තිබීම සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනයට මෙන්ම ධීවර කර්මාන්තයට ද බාධා ගෙන දෙන බැවින් එම තත්ත්වය වළක්වාලීම සඳහා මෙන්ම මෙම ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව වෙරළ පිවිසුම් මාර්ග පද්ධතියක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.112/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— විදුහල්පති සේවය, ගුරු අධ්‍යාපන සේවය, අධ්‍යාපන පරිපාලන සේවය යන සේවාවල දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින්, එම තත්ත්වය මඟ හරවා ඔවුන්ගේ ආත්මාභිමානයට සරිලන වැටුපක් ලැබෙන පරිදි වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.113/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ භික්ෂු අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම,— බෞද්ධ භික්ෂූන්වහන්සේලාගේ ධර්ම ඥානය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව උන්වහන්සේලාගේ කථන හැකියා, ශ්‍රවණ හැකියා, පරිගණක, මනෝවිද්‍යාත්මක සහ උපදේශනය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම උදෙසා දැනට පවත්නා භික්ෂු අධ්‍යාපන ආයතනවලට පරිබාහිරව මෙම කටයුතු සඳහාම වෙන් වූ භික්ෂු අධ්‍යාපන ආයතන ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.114/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ දැනට ක්‍රියාත්මක වන නොතාරිස් සේවාව යාවත්කාලීන කිරීම,— දිවයින තුළ ක්‍රියාත්මක වන නොතාරිස් සේවය යල්පැන ගිය නීතිවලින් සකස් වී ඇති නිසා ඒ පිළිබඳව යළි සලකා බලා වර්තමානයට ගැලපෙන ලෙස නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.115/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— වියළි කලාපීය හේන් ගොවීන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— වියළි කලාපීය ප්‍රදේශවල හේන් ගොවීන් විසින් වගා කරනු ලබන වී, කුරක්කන්, මුං, තල වැනි වගාවන්හි අස්වැන්න වැඩි කර ගැනීම සහ නිෂ්පාදන සකස් කිරීම සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම තුළින් උසස් ගුණාත්මක තත්ත්වයෙන් යුතු නිෂ්පාදන සකස් කිරීම

සඳහාත්, දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ තුළ නිෂ්පාදන අලෙවි කර ගැනීමේ පදනම ශක්තිමත් කර ගැනීම සඳහාත් සීමිත සමූපකාර සමාගම් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.116/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ගුරු උපදේශක සේවාවක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණ ඇතිව මීට වසර විස්සකට(20) පමණ පෙර සිට ආරම්භ වී ක්‍රියාත්මක වන ගුරු උපදේශක තනතුරු වෙනම ගුරු උපදේශක සේවා ඒකකයක් ලෙස ස්ථාපනය කල යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.118/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— තිරිඟු පිටි වෙනුවට සහල් පිටි ජනතාව අතර ජනප්‍රිය කරවීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම,— තිරිඟු පිටි සඳහා විදේශ රටවලට ඇදී යන විශාල ධනස්කන්ධය නවතාලීමේ අරමුණ ඇතිව ආදේශකයක් ලෙස භාවිතා කළ හැකි සහල් පිටිවලින් සැකසූ ආහාර ප්‍රචලිත කිරීම සඳහාත්, කෙඳි සහිත ධාන්‍ය වර්ගයක් වන සහල් වඩාත් සියුම් ලෙස තිරිඟු පිටි මෙන් අඹරා ගැනීම සඳහාත්, තිරිඟු පිටි ඇඹරීමට භාවිතා කරන ආකාරයේ යන්ත්‍ර සූත්‍ර සහ නව තාක්ෂණය හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.119/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— යුද්ධය නිසා ආබාධිතයන් බවට පත්වූවන්ට සහන සලසා දීම,— වසර 30කට ආසන්න කාලයක් පැවැති යුද්ධය හේතුකොට ගෙන එදිනෙදා කුලී වැඩ කොට ජීවත් වූ ජනතාවත් ස්ථිර රැකී රක්ෂා කළ ජනතාවත් අතරින් සැලකිය යුතු ප්‍රමාණයක් අංගවිකලව ආබාධිතව ජීවන බරින් මහත් පීඩාවට පත් වී අසරණව ජීවත් වන බැවින්, ඔවුන් සඳහා යම් මාසික දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.120/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලුම ප්‍රභූ ආරක්ෂකයින් සඳහා ගමන් වියදම් දීමනාවක් ලබා දීම,— ජනාධිපති ආරක්ෂක සහ අගමැති ආරක්ෂක සේවයේ නියුක්ත නිලධාරීන්ට මෙන්ම අනෙකුත් ප්‍රභූ ආරක්ෂක සේවාවල නියුක්ත නිලධාරීන්ට ද සමාන ගමන් වියදම් දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.127/'11

ගරු රවී කරුණානායක මහතා,— ගාල්ල ජාත්‍යන්තර ක්‍රීඩාංගණය නැවත නම් කිරීම,— නිදහස් අධ්‍යාපනයේ පියා වන දිවංගත ගරු (ආචාර්ය) සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතාට ගෞරවයක් වශයෙන් ගාල්ල ජාත්‍යන්තර ක්‍රීඩාංගණය එතුමාගේ නමින් නැවත නම් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.130/'11

ගරු රවී කරුණානායක මහතා,— මැතිවරණ ක්‍රියාවලිය සහ මැතිවරණ පැවැත්වීම පිළිබඳව පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කිරීම,— මැතිවරණ ක්‍රියා පටිපාටිය සහ මැතිවරණ පැවැත්වීම පිළිබඳව පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් ස්ථිර පදනමකින් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.131/'11

ගරු රවී කරුණානායක මහතා,— සේවක අර්ථසාධක අරමුදලින් සහ සේවක භාරකාර අරමුදලින් කඩිනමින් මුදල් ගෙවීම,— සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ දායකත්වය දරන සියලුම සාමාජිකයින්ට ගෙවිය යුතු මුදල් ක්‍රියාකාරී සේවයෙන්

විශ්‍රාම ගෙන එක් මසක් ගතවීමෙන් අනතුරුව ගෙවීම සඳහා විධිවිධාන සැළසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.132/’11

ගරු රවි කරුණානායක මහතා,— රාජ්‍ය මාධ්‍යවල අපක්ෂපාතීත්වය තහවුරු කිරීම,— රාජ්‍ය මාධ්‍ය ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට පමණක්ම හිමි වූ තනි අයිතිවාසිකමක්වන නිසාත්, රජයේ මාධ්‍ය නිරන්තරවම දේශපාලනීකරණයට ලක්වීමක් සිදුවී තිබෙන නිසාත් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වී සිටින සියලුම දේශපාලන පක්ෂවලට රාජ්‍ය මාධ්‍ය තුළින් සමාන ලෙස සැලකීම සහ සමාන ලෙස අවස්ථාවන් ලබාදීම තහවුරු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.133/’11

ගරු රවි කරුණානායක මහතා,— රාජ්‍ය සේවයේ භාෂා ප්‍රවීණත්වයේ අවශ්‍යතාව,— වර්ෂ 2025 වන විට සියලුම රජයේ සේවකයන්ට සිංහළ, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම වැඩ කටයුතු කිරීමට, ලිපි හුවමාරු කර ගැනීමට සහ කථා කිරීමට හැකි වීම රජය විසින් අනිවාර්ය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.134/’11

ගරු රවි කරුණානායක මහතා,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විමධ්‍යගත අයවැයෙන් ප්‍රතිපාදන වෙන්කරදීම,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225 දෙනා වෙත, දළ ජාතික නිෂ්පාදිතයෙන් 1% කට සමාන වූ විමධ්‍යගත අයවැය මුදලක් වාර්ෂිකව වෙන්කළ යුතු බවත් එම වෙන්කිරීමෙන්, 50% ක් ප්‍රාග්ධන වියදම් වශයෙන් උපයෝගීකර ගැනීමටත් ශේෂය රජයේ නිර්ණායක මත පදනම්ව තම ඡන්ද දායකයින් වෙනුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ අභිමතය පරිදි කවර හෝ පදනමකින් උපයෝගී කර ගැනීම සඳහාත් හිමිකම් ලබා දිය යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.138/’11

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යන පාඨමාලාවන් රැකියාභිමුඛ පාඨමාලාවන් බවට පත්කිරීම,— දිවයිනේ සියලුම රජයේ විශ්වවිද්‍යාල සහ පෞද්ගලික විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යන ශාස්ත්‍රීය අධ්‍යාපනයම සඳහා වූ උපාධි පාඨමාලාවන් රැකියාභිමුඛ වෘත්තීයමය උපාධි පාඨමාලාවන් බවට පරිවර්තනය කර එමගින් බිහිවන්නා වූ උපාධිධාරීන් වෙත නව රැකියා සපයා දීමේ අරමුණ ඇතිව, සියලුම විශ්වවිද්‍යාල සමඟ රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ ආයතන සම්බන්ධීකරණය සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.139/’11

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් සිසුන් ප්‍රවාහනය කරනු ලබන වෑන් රථ සඳහා නිසි ප්‍රමිතීන් නියම කිරීම,— දිවයින පුරා පවත්වාගෙන යනු ලබන පාසල් සිසු ප්‍රවාහන සේවාවන් නියමිත ප්‍රමිතියෙන් නොපවතින බැවින් සහ ඇතැම් පාසල් වෑන් රථ සේවකයින්ගේ පැවතුම් යහපත් තත්ත්වයෙන් නොපවතින බැවින්, නිසි ප්‍රමිතියෙන් යුතු වෑන් රථ සේවාවක් පවත්වාගෙන යෑම සඳහාත්, එම සේවාවන් ලබාගන්නා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහාත්, වෑන් රථ සේවාවන් සඳහා ප්‍රමිතීන් හඳුන්වාදිය යුතුයැයි ද, වෑන් රථ සේවකයින් තුළ යහපත් පැවතුම් පවත්වාගෙන යාම සඳහා විනය නීති මාලාවක් හඳුන්වා දිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.144/’11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— සම්ප්‍රදායික කර්මාන්ත සංවර්ධනය කිරීම,— අම්පාර දිස්ත්‍රික්කයේ අභාවයට යන සම්ප්‍රදායික කර්මාන්ත වන අත් යන්ත්‍ර පේෂ කර්මාන්තය, කුඹල් කර්මාන්තය, තල් කොළ හා පන් ගස්වලින් පෙට්ටි, වට්ටි හා පැදුරු විවීම, කොහු කර්මාන්තය හා වේවැල් කර්මාන්තය යනාදිය සංවර්ධනය කර, එම ප්‍රදේශයේ ජනතාවට රැකියා

අවස්ථාවන් උදාකර දීමෙන් ඔවුන්ගේ ආදායම නංවාලීමට රජය කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.147/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— රට ඉඳි වගාව හඳුන්වාදීමේ හැකියාව විමසා බැලීම සඳහා පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම,— රට ඉඳි ශාඛය (ෆීනික්ස් ඩැක්ටිලිෆෙරා) අප රටේ වගා කිරීම සම්බන්ධයෙන් මඩකලපුව දිස්ත්‍රික්කයේ කාත්තන්කුඩිහි සිදු කරන ලද අත්හදා බැලීමක් සාර්ථක බව පෙනී ගොස් ඇති හෙයින්, අප රටේ ජනතාවට අපේම පොළවේ වවන ලද මෙම රසවත් පළතුර භුක්ති විඳීමට අවස්ථාව සලසනු පිණිස, රට ඉඳි වගාව හඳුන්වා දීමේ හැකියාව විමසා බලන පුළුල් අධ්‍යයනයක් සිදු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.151/'11

ගරු රවි කරුණානායක මහතා,— ගුවන් විදුලි විකාශ නියාමනය කිරීම,— ගුවන් විදුලි විකාශ නියාමනය කිරීමේ ස්වාධීන අධිකාරියක් සංස්ථාගත කිරීම සඳහා නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.152/'11

ගරු රවි කරුණානායක මහතා,— රූපවාහිනී වැඩසටහන් විකාශය නියාමනය කිරීම,— රූපවාහිනී වැඩසටහන් විකාශය නියාමනය කිරීමේ ස්වාධීන අධිකාරියක් සංස්ථාගත කිරීම සඳහා නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.153/'11

ගරු රවි කරුණානායක මහතා,— මහ නගර සභාවලට රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා හඳුන්වා දීම,— 2013 ජනවාරි මස 01 වැනි දින වන විට සෑම මහ නගර සභාවකම රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා පිහිටුවීම සඳහා නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.154/'11

ගරු රවි කරුණානායක මහතා,— හිමිකම් පනත සම්මත කිරීම,— මානව අභිමානය, සමානාත්මතාව සහ නිදහස යන ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් තහවුරු කරන දකුණු අප්‍රිකාවේ ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම වන හිමිකම් පනත හා සමානව රටේ සියලු ජනතාවගේ හිමිකම් සහතික කරමින් එම පනතේ නිශ්චිතව දැක්වෙන සීමාවන්ට යටත්ව රාජ්‍යය විසින් ඒවා ගරු කළ යුතු, ආරක්ෂා කළ යුතු, ප්‍රවර්ධනය කළ යුතු හා ඉටුකර දිය යුතු බවට විධිවිධාන සලස්වන පනතක් ශ්‍රී ලංකාවේ සම්මත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.155/'11

ගරු රවි කරුණානායක මහතා,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විශේෂ දීමනා ගෙවීම,— රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් අනුමත කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබුවහොත් හැර කිසිදු අමාත්‍යවරයෙකුට, නියෝජ්‍ය අමාත්‍යවරයෙකුට හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට කිසිදු විශේෂ දීමනාවක් නොගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.158/'12

ගරු රවි කරුණානායක මහතා,— ශ්‍රී ලංකාවේ වරායන් සංවර්ධනය කිරීම,— ශ්‍රී ලංකාව භූගෝලීය වශයෙන් වාසිදායක ආකාරයට ස්ථානගත වූ කේන්ද්‍රස්ථානයක පිහිටා ඇති බවට ප්‍රචලිතව තිබීමත්, පුරාතනයේ සිටම නැව් ප්‍රවාහන සේවය ඉතා වැදගත් සේවා කර්මාන්තයක් වීමත් සහ ඉන්දියාව ඉතාම අධිෂ්ඨානශීලීව වරායන් සංවර්ධනය සහ ප්‍රවර්ධනය කිරීමෙහි නිරතව

සිටීමත් නිසා අප ඉන්දියාව සහ ඉන්දීය ව්‍යාපාර සමග එක් වී දෙරටේම යහපත පිණිස වරායන් සංවර්ධනය කිරීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.159/’12

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික සහ ජාත්‍යන්තර අනාගත ඉල්ලුමට සරිලන ලෙස නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම,— ජාතික සහ ජාත්‍යන්තර ප්‍රජාවගේ අනාගත ඉල්ලුමට සරිලන කාර්මික සහ කෘෂිකාර්මික නිෂ්පාදනයන් පිළිබඳව පුරෝකථනයක් කර අදාළ නිෂ්පාදනයන්ට අනුබද්ධිත සියලුම ක්ෂේත්‍රවල අන්තර් සම්බන්ධතාවයක් තුළින් ද, නවීන තාක්ෂණය උපරිම මට්ටමින් ප්‍රයෝජනයට ගනිමින් ද, නිෂ්පාදන ක්‍රියාවලිය වර්ධනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.160/’12

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික උරුමයන් රැකගැනීම සඳහා ඩිජිටල් පුස්තකාලයක් ඇති කිරීම,— ශ්‍රී ලාංකික ජනතාවගේ සම්ප්‍රදායික දැනුම ආරක්ෂා කරමින්, පෝෂණය කර අනාගත පරම්පරාව වෙත රැගෙන යාම සඳහා ද, ජාන සම්පත් හා ජෛව උරුමයන් අපහරණය වැළැක්වීම සඳහා පුළුල් ජාතික වැඩපිළිවෙළක් අවශ්‍යව ඇති බැවින් ද, පරිසරය, දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය, කෘෂිකර්මාන්තය හා සම්ප්‍රදායික කර්මාන්ත ඇතුළු සියලු ක්ෂේත්‍රයන් සඳහා ඩිජිටල් තාක්ෂණය උපයෝගී කරගත් නවීන පුස්තකාලයක් සකස් කිරීමට ද, ඒ සඳහා ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO), ශ්‍රී ලංකා බුද්ධිමය දේපළ කාර්යාංශය, පරිසර අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ඒකකය ඇතුළු සියලු අංශ ඒකාබද්ධවූ වැඩපිළිවෙළක් සකස් කිරීමට ද පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.161/’12

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික දැනුම ආරක්ෂා කර ගැනීම සඳහා වූ ජාතික වැඩපිළිවෙළක් ආරම්භ කිරීම,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික දැනුම භාවිතා වන වෛද්‍ය ක්‍රම, කෘෂිකර්මාන්තය, ආහාර සංරක්ෂණය, හස්ත කර්මාන්ත අංශය ඇතුළු විවිධ ක්ෂේත්‍රයන්හි පාරම්පරික දැනුම ආරක්ෂා කිරීම සඳහා අදාළ ක්ෂේත්‍රයන් නියෝජනය කෙරෙන ජනතාවගෙන් තොරතුරු ලබාගෙන, ජෛව විවිධත්ව ඒකකය, බුද්ධිමය දේපළ කාර්යාංශය ඇතුළු අදාළ අංශ ඒකාබද්ධව ජාතික වැඩපිළිවෙළක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.162/’12

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවට ආවේණික හා ඖෂධමය වටිනාකම්වලින් යුතු ශාකවල ජාන සම්පත්වලට පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම,— විදේශීය රටවල් ශ්‍රී ලංකාවට ආවේණික වටිනා ඖෂධමය ශාකවල සක්‍රිය රසායනික ද්‍රව්‍ය සහ ජාන සම්පත් හඳුනා ගෙන, ඒවාට වංචනික ලෙස පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම වැළැක්වීම සඳහා අදාළ සක්‍රිය රසායනික ද්‍රව්‍ය සහ ජාන සම්පත් සඳහා ශ්‍රී ලංකාවට පේටන්ට් බලපත්‍ර ලබා ගැනීමටත්, ඖෂධ නිෂ්පාදනයට සහ වැඩි දියුණු කිරීමට එම කොටස් යොදා ගැනීමටත්, ජෛව විවිධත්ව අංශය, බුද්ධිමය දේපළ කාර්යාංශය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ඇතුළු වගකිවයුතු සියලු ආයතන එක්ව විශේෂ වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.163/’12

ගරු බුද්ධික පතිරණ මහතා,— ජනතා නියෝජිතයින්ගේ ගරු නාම අත්හැරීම,— ජනාධිපතිතුමා, අගමැතිතුමා ඇතුළු පාර්ලිමේන්තු, පළාත් සභා, ප්‍රාදේශීය සභා නියෝජනය කරන සියලුම ජනතා නියෝජිතයන් මාසිකව තමන් කරන සේවයට අදාළව වැටුප් හා / හෝ දීමනා ලබා ගන්නා අතර ඉහත කිසිදු ධූරයක් නිස්සරණධ්‍යාසයෙන් සිදු කරනු ලබන ගරු සේවයන් නොවන බැවින් ද, එම ධූර දරන්නන්ගේ නමට ඉදිරියෙන් හෝ ධූරයට ඉදිරියෙන් අතිගරු, ශ්‍රීමත් හෝ ගරු යන නාම සහ නමට පසුව උතුමාණන්, මැතිතුමා යන පද යෙදීම

උපහාසයට ලක්වීමට හේතුවක් වී ඇති බැවින් ද, ජනතා නියෝජිතයන්ගේ ගරු නාම භාවිතය නතර කිරීමට අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 164/'12

ගරු රවි කරුණානායක මහතා,— සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ස්වාධීන ආයතනයක් බවට පරිවර්තනය කිරීම,— දේශපාලන මැදිහත්වීම් සහ දේශපාලන අනුග්‍රහයන්ට විශේෂයෙන් සම්බන්ධ සියලුම බාධකයන් ඉවත් වන පරිදි, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ස්වාධීන ආයතනයක් බවට පරිවර්තනය කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 165/'12

ගරු රවි කරුණානායක මහතා,— තැපැල් ඡන්ද ප්‍රකාශ කිරීම වෙනුවට "කලින් ඡන්ද ප්‍රකාශ කිරීම" හඳුන්වා දීම,— වත්මන් මැතිවරණ ක්‍රමය තුළ පවත්නා බොහෝ අඩුපාඩු මගහරවා වඩාත් සතුටුදායක තත්ත්වයකට පත්කිරීමට සහය වනු පිණිස, තැපැල් ඡන්ද ප්‍රකාශ කිරීම වෙනුවට "කලින් ඡන්ද ප්‍රකාශ කිරීම" හඳුන්වාදීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 166/'12

ගරු රවි කරුණානායක මහතා,— විවෘත ඡන්ද හිමි නාම ලේඛනයක් හඳුන්වාදීම පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම,— ඡන්ද හිමි නාම ලේඛනය වර්තමානයෙහි පවත්වාගෙන යන ස්ථාවර ආකාරයේ නාම ලේඛනයක් වෙනුවට විවෘත නාම ලේඛනයක් බවට පත් කරනු පිණිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.170/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩසටහන පළාත්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කිරීම,— විවිධ පාර්ශ්වයන් විසින් වැඩිහිටි පුරවැසියන් නොසලකා හැරීම තුළින් සිදුවන විවිධ අසාධාරණයන් සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා සමාජ සේවා අමාත්‍යාංශයේ වැඩිහිටි ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩසටහන පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.171/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි ප්‍රජාව ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට දායක කර ගැනීමට ණය දීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති වැඩිහිටි ප්‍රජාවට තම ජීවනෝපාය මාර්ග ශක්තිමත් කරගනිමින් සමස්ත ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනයට දායකවීමට බැංකු පද්ධතිය මගින් ණය දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවීම ඔවුන්ට සමාජය තුළ වෙනත් අකාරයකට සැලකීමක් වන හෙයින් එම අසාධාරණ තත්ත්වය වැළැක්වීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.172/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති පුද්ගලයින් සමාජය තුළ සක්‍රීය පුද්ගලයින් බවට පත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම,— සමාජ ආර්ථික ක්‍රියාවලියේ ප්‍රගමනය උදෙසා තම ශ්‍රමය කැප කර වයස අවුරුදු 60 ඉක්මවීමෙන් පසු සමාජය තුළ නිසි පිළිගැනීමක් නොමැතිව අක්‍රීයව කොන්වී සිටින වැඩිහිටියන්, සමාජයේ සක්‍රීය පුද්ගලයින් බවට පත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීමට පාසල් ප්‍රජාව ඇතුළු මුළු මහත් සමාජයම දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.175/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ක්ෂේත්‍රය පිළිබඳ පාසල් සිසුන්ගේ දැනුම පුළුල් කිරීම,— ශ්‍රී ලංකාවේ අනාගත තරුණ තරුණියන්ගේ රැකියා ප්‍රශ්නයට විසඳුමක් ලෙස සහ මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ ඇතිවන්නාවූ වර්ධනයට සාපේක්ෂව පුහුණු ශ්‍රමිකයින්ගේ අවශ්‍යතාව සපුරා ගැනීමේ අරමුණ ඇතිව පාසල් විෂය නිර්දේශයට මෝටර් කාර්මික ශිල්පය විෂයයක් ලෙස ඇතුළත් කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.176/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ශිල්පය ඉගැන්වීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමට අධ්‍යාපන විද්‍යා පීඨයක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ සහ විදේශ රටවල මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ ඇතිවන වර්ධනයට සරිලන ලෙස, එම ක්ෂේත්‍රයේ පුහුණු ශ්‍රමිකයින්ගේ ඉල්ලුම සපුරාලීමට හැකිවන පරිදි, පාසල් මට්ටමින් ඉගැන්වීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමට මෝටර් කාර්මික ක්ෂේත්‍රය පිළිබඳ අධ්‍යාපන විද්‍යා පීඨයක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.177/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ශිල්පය විෂය නිර්දේශයන් යාවත්කාලීන කිරීම,— මෝටර් කාර්මික ක්ෂේත්‍රය හා සම්බන්ධ රජයේ කාර්මික විද්‍යාල හා අනුබද්ධ ආයතනවල ඉගෙනුම් කටයුතු සිදු කරනු ලබන්නේ වසර 25-30 ක් තරම් පැරණි විෂය නිර්දේශයක් යටතේ බැවින්, එම තත්ත්වය වෙනස් කිරීම සඳහා එම විෂය නිර්දේශයන් යාවත්කාලීන කිරීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.178/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— ත්‍රිරෝද රථ හා යතුරු පැදි ආශ්‍රිත රැකියාවල නියුක්ත වූවන්ගේ රැකියාවල සුරක්ෂිතභාවය තහවුරු කිරීම,— ශ්‍රී ලංකාව තුළ ජීවත්වන ත්‍රිරෝද රථ හා යතුරුපැදි ආශ්‍රිතව ඍජු හා වක්‍ර ලෙස රැකියාවන්හි නියුක්තවීමට කැමැත්තක් දක්වන තරුණ පිරිස හා විශ්‍රාමික ත්‍රිවිධ හමුදා නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් යන ජන කණ්ඩායම්වල ආර්ථික ශක්තිය වර්ධනය කිරීමෙන් සමස්ත ජාතික නිෂ්පාදිතයට ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීමේ අරමුණ ඇතිව එම ක්ෂේත්‍රයේ නියුක්තවූවන්ගේ සක්‍රීය දායකත්වය ජාතික ආර්ථිකයට එක් කර ගැනීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් කඩිනමින් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.179/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකීය/දේශීය සූපවේදය පිළිබඳ රට තුළ ජනතා ආකල්ප පුළුල් කිරීම,— ශ්‍රී ලාංකීය/දේශීය ආහාර කලාව පිළිබඳ දේශීය හා විදේශීය ජනතාව තුළ වැඩි නැඹුරුවක් ඇති කිරීමේ අරමුණ ඇතිව, රට තුළ ජනතා ආකල්ප ඒ වෙත යොමු කිරීම සඳහා පාසල්, විශ්වවිද්‍යාල, තෘතීයික අධ්‍යාපන ආයතනවල විෂය පාඨමාලාවට සූපවේදය විෂයයක් ලෙස ඇතුළත් කිරීමටත්, රාජ්‍ය හා පෞද්ගලික අංශවල මැදිහත්වීම මත පර්යේෂණ අංශ දිරිගැන්වීම මගින් නව සොයාගැනීම් සිදු කිරීමටත්, ඒ හා බැඳුනු ආයතන පද්ධතිය සම්බන්ධ කර ගනිමින් සහතික පත්‍ර, ඩිප්ලෝමා, උපාධි, පශ්චාත් උපාධි පාඨමාලා ඇති කිරීම තුළින් මෙම ක්ෂේත්‍රය පිළිබඳ ජනතාව තුළ පුළුල් ආකල්පමය වෙනසක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.180/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවේ ආහාර සංස්කෘතිය ඉගෙනුම් සහ ඉගැන්වීමේ ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලාංකීය ආහාර කලාව, රස කාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංශ ගණනාවකින්

සකස්වී ඇති අතර ඒ හා බැඳුණු ශ්‍රී ලාංකීය ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මෙන්ම දේශීය හා විදේශීය ජනතාව අතර අපගේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීම මගින් ශ්‍රී ලාංකීය අනන්‍යතාව අන්තර්ජාතිකව ඔසවා තැබීම සඳහා වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.183/'13

ගරු අජිත් පී. පෙරේරා මහතා,— මෝටර් වාහන හා සම්බන්ධ වන්දි නඩු සඳහා ලඝු කාර්ය පටිපාටියක් හඳුන්වාදීම,— මෝටර් වාහන හා සම්බන්ධ හදිසි අනතුරුවලින් මියගිය තැනැත්තන්ගේ උරුමකරුවන්ට සහ යැපෙන්නන්ට ද, එවැනි හදිසි අනතුරුවලින් තුවාල ලැබූ තැනැත්තන්ට ද වන්දි ලබාගැනීම සඳහා ඉතා අසීරු සහ දීර්ඝ අධිකරණ ක්‍රියාදාමයකට සහභාගීවීමට සිදුවීමෙන් ඔවුන් ඉතා අසරණ තත්ත්වයකට පත්වන බැවින්, මෝටර් වාහන හා සම්බන්ධ වන්දි නඩු සඳහා ලඝු කාර්ය පටිපාටියක් හඳුන්වා දෙන පරිදි සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 186/'13

ගරු රවි කරුණානායක මහතා,— මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වාදීම,— දිළිඳු ජනතාවගේ මූලික මිනිස් අයිතිවාසිකම් කඩවීම, රාජ්‍ය ප්‍රතිපත්තිවල අඩංගු දේ හෝ ඒවායේ බලපෑම, පොදු කටයුතු ඉටු කිරීමට නාගරික අධිකාරයන්ට බලපෑම් කිරීම, ආගමික අයිතිවාසිකම් හෝ අනෙකුත් මූලික අයිතිවාසිකම් කඩවීම සහ අධික මහජන ණය හා පුරවැසියන් අතිරේක වගකීම්වලට යොමු කෙරෙන දූෂණය යන කරුණු සම්බන්ධයෙන් මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.187/'13

ගරු රවි කරුණානායක මහතා,— අමාත්‍ය ආරක්ෂක අංශ නිලධාරීන් දේශපාලනඥයන්ට පමණක් සීමා කිරීම,— අමාත්‍ය ආරක්ෂක අංශය (MSD) මඟින් සපයා දෙනු ලබන ආරක්ෂක නිලධාරීන් දේශපාලනඥයන්ට පමණක් සීමා කළ යුතු බවත් ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්ට ලබා නොදිය යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.188/'13

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ජාතික ක්‍රීඩාව වන වොලිබෝල් ක්‍රීඩාව නගා සිටුවීම,— ඉහළ තලයේ කුසලතාවක්, කඩිසරභාවයක්, ශාරීරික යෝග්‍යතාවයක්, ක්ෂණික තීරණ ගැනීමක් සහ කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමක්, අවශ්‍ය කරන ප්‍රශස්ත ක්‍රීඩාවක් වන වොලිබෝල් ජාතික ක්‍රීඩාව නගා සිටුවීම සඳහා හොඳින් සැලසුම් කළ වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.189/'13

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— බීරළු නමින් හඳුන්වනු ලබන සම්ප්‍රදායික අත්යන්ත්‍ර රේන්ද කර්මාන්තය නගා සිටුවීම,— රේන්ද නිෂ්පාදනයේ නිරත ග්‍රාමීය ජනතාවට ඉහළ ආදායමක් ලබා ගැනීමට හැකියාව සලසා දීම සඳහා ඔවුන්ට නවීන පහසුකම් දෙමින් බීරළු ගෘහස්ත කර්මාන්තය වැඩි දියුණු කිරීමට සහ රේන්ද සහ රේන්ද නිෂ්පාදන සංචාරකයන් අතර ජනප්‍රිය කරවීමට ඵලදායී සහ අර්ථවත් පියවර ගත යුතුයැයි, මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.190/'13

ගරු රවි කරුණානායක මහතා,— ආර්ථික හේතූන් මත තරුණ මව්වරුන් ශ්‍රී ලංකාවෙන් පිටවී යාම වැළැක්වීමට නීති පැනවීම,— ශක්තිමත් සහ ප්‍රීතිමත් පවුල් පරිසරයක් ගොඩනැගීම සඳහා තරුණ මව්වරුන් විසින් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලබන හෙයින් ද, මෑත කාලයේදී එවැනි මව්වරුන් ශක්තිමත් පවුල් ඒකකයක පවතින සාරධර්ම විනාශකර දමමින් සහ බරපතල සමාජ අර්බුදයක් නිර්මාණය කරමින් විදේශ රැකියා සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව ගිය හෙයින් ද, අවුරුදු පහට වඩා අඩු වයසැති දරුවන් සිටින මව්වරුන් ආර්ථික හේතූන් මත ශ්‍රී ලංකාවෙන් බැහැරවීම වැළැක්වීමට සුදුසු නීති පැනවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.191/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල සහ තෘතීයික අධ්‍යාපන ආයතනවල සිසුන්ගේ පර්යේෂණ නිබන්ධන අමාත්‍යාංශවල සංවර්ධන කටයුතු ඉලක්ක කර සකස් කිරීම,— විශ්වවිද්‍යාල සහ තෘතීයික අධ්‍යාපන ආයතනවල සිසුන් විසින් තම පාඨමාලා සම්බන්ධයෙන් ඉදිරිපත් කරන පර්යේෂණ නිබන්ධන රටේ ආර්ථික, සමාජීය, සංස්කෘතික හා සංවර්ධන කටයුතුවලට උපයෝගී කර ගැනීම වැදගත් වන බැවින් එම නිබන්ධන අධීක්ෂණය කරනු ලබන ආචාර්යවරු හා පර්යේෂණ නිබන්ධන අදාළ වන අමාත්‍යාංශ අතර මනා සම්බන්ධීකරණයක් ඇති කිරීම සඳහා එකී අමාත්‍යාංශයේ නිලධාරියෙකු පත්කිරීමෙන් එම පර්යේෂණ නිබන්ධන මගින් අමාත්‍යාංශයේ ඉදිරි සංවර්ධන ක්‍රියාදාමයන් සහ කාලීන ඉලක්ක සපුරා ගැනීමට හැකිවන පරිදි ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.192/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— වයස අවුරුදු 18 සම්පූර්ණ වන අවස්ථාවේදීම ඡන්ද හිමි නාමලේඛනයට නම ඇතුළත් කිරීම,— මැතිවරණ දෙපාර්තමේන්තුව මගින් වාර්ෂිකව ඡන්ද හිමි නාමලේඛන සංශෝධනය කිරීමට නියමිත දිනට පසුව හෝ පෙර දිනකදී වයස අවුරුදු 18 සම්පූර්ණ වන තැනැත්තන්ට නියමිත වයස සම්පූර්ණ වූ දිනටම ඡන්ද හිමි නාමලේඛනයෙහි නම ඇතුළත් කරවා ගත හැකි ආකාරයේ ප්‍රායෝගික වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.193/'13

ගරු රවී කරුණානායක මහතා,— "ජාතික සෞඛ්‍ය සහා නිලතන්ත්‍රයක්" ඇති කිරීම,— සෞඛ්‍ය සේවාව කළමනාකරණය කිරීම කෙරෙහි අද පවතිනවාට වඩා ඉහළ මට්ටමේ පාලනයක් සහ අවධාරණයක් තිබිය යුතු හෙයින්, රේඛීය අමාත්‍යාංශයේ තිබෙන උපප්‍රශස්තිකරණය ඉවත්කර දැමීමට හා කපා හැරීමට උපකාරී වන සහ අග්‍රාමාත්‍යවරයාට වාර්තා කරන "ජාතික සෞඛ්‍ය සහා නිලතන්ත්‍රයක්" නිර්මාණය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.195/'13

ගරු රවී කරුණානායක මහතා,— විශ්‍රාම පාරිතෝෂිකය මත පනවා ඇති බදු නිදහස් කිරීම,— මෙරටෙහි පනවා ඇති බදු ඉතා අසමතුලිත තත්ත්වයක පවතින අතර වෙහෙසකර දිවියකින් අනතුරුව විශ්‍රාම ලබද්දී විශ්‍රාම පාරිතෝෂිකය ලබාගන්නා සේවකයන්ට 36% ක බදු ප්‍රමාණයක් ගෙවීමට සිදුවන බැවින්, විශේෂයෙන්ම ආන්තික ප්‍රතිලාභ සහ විශ්‍රාම පාරිතෝෂිකය මත පනවා ඇති බදු සම්පූර්ණයෙන්ම නිදහස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.196/'13

ගරු රවී කරුණානායක මහතා,— එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිත්‍ය අසුනක් ලබාගැනීම සඳහා ඉන්දියාවට සහාය වීම,— ඉන්දියාව ශ්‍රී ලංකාවේ සමීපතම මිතුරා වන බැවින් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිත්‍ය අසුනක් ලබාගැනීම සඳහා ඉන්දියාවට සහාය ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.197/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ සේලයින් නිෂ්පාදනය කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කිරීම,— ශ්‍රී ලංකාව තුළ වාර්ෂිකව සේලයින් විශාල ප්‍රමාණයක් භාවිතා කරනු ලබන අතර සේලයින් ආනයනය කිරීම සඳහා ද විශාල මුදලක් වාර්ෂිකව විදේශීය රටවලට ඇදී යන බැවින්, එම විදේශ විනිමය ප්‍රමාණය රට තුළ ඉතිරි කර ගැනීමේ අරමුණ ඇතිව ලංකාව තුළ පවත්නා දේශීය තාක්ෂණය යොදාගෙන සේලයින් නිෂ්පාදනය කිරීම සඳහා රාජ්‍ය, පෞද්ගලික හෝ සමුපකාර අංශයන් සම්බන්ධ කර ගනිමින් ක්‍රමවත් වැඩපිළිවෙළක් රජය මැදිහත් වීමෙන් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.198/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— පොල් වතුර ආශ්‍රිතව නව නිෂ්පාදනයන් ඇති කිරීම,— ශ්‍රී ලංකාව තුළ වාර්ෂිකව විශාල ප්‍රමාණයක පොල් වතුර අපතේ යන බැවින්, නව තාක්ෂණය යොදා ගනිමින් විධිමත් ක්‍රමවේදයක් යටතේ පොල් වතුර ආශ්‍රිතව නව නිෂ්පාදනයන් දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.199/'13

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— අපනයන වෙළඳපොළ සඳහා දූරියන් වගා කිරීම,— මෙරටට සැලකිය යුතු විදේශ විනිමය ආදායමක් ඉපැයිය හැකි වන පරිද්දෙන්, මිල අධික නමුදු අපනයන වෙළඳපොළෙහි ඉහළ ඉල්ලුමක් සහිත ජනප්‍රිය පලතුරු වර්ගයක් වන දූරියන් වාණිජ මට්ටමෙන් වගා කරනු පිණිස පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.200/'13

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ත්‍රි භාෂා ශ්‍රී ලංකාවක් සඳහා වූ දස අවුරුදු සැලැස්ම,— "ත්‍රි භාෂා ශ්‍රී ලංකාවක් සඳහා වූ 2012-2021 දස අවුරුදු සැලැස්ම" යන මැයෙන් වූ දස අවුරුදු සැලසුමට හිමිවූ අමාත්‍ය මණ්ඩල අනුමතියට ප්‍රසංශාව පළ කරන අතර, මෙම ව්‍යාපෘතිය සීග්‍රයෙන් හා දීප ව්‍යාප්තව බහු භාෂාවන් කථා කරන බහු වාර්ගික ජනතාවගේ පූර්ණ සහය ලබාගෙන, රාජ්‍ය සහ පුද්ගලික ආයතනවල සහයෝගයෙන් මුළු රටටම ප්‍රයෝජනවත් වන ආකාරයෙන් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.77/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය සේවයේ විශ්‍රාමිකයින්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— 2006/6 වැටුප් ප්‍රතිශෝධන චක්‍ර ලේඛයට අනුව 2006.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය සේවකයන්ගේ වැටුප් පරිවර්තනය කිරීම නිසා 2006.06.01 දිනට පෙර විශ්‍රාම ගිය සහ ඉන්පසු විශ්‍රාම ගිය රාජ්‍ය සේවකයන් අතර දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින් එය ඉවත් කිරීමට ජාතික වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.201/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— සාගරයේ නව සම්පත් ගවේෂණය,— විශාල සාගර කලාපයක් හිමි රටක් වූ ශ්‍රී ලංකාව ප්‍රමුඛත්වය ලබා දී ඇත්තේ ධීවර කර්මාන්තය සඳහා පමණක් වන අතර සාගරය ආශ්‍රිතව විශාල ප්‍රමාණයක සවභාවික සම්පත් ඇති බැවින් මෙරටට විශාල රැකියා අවස්ථා ප්‍රමාණයක් මෙන්ම ධනයක් ද උපයා ගැනීමේ අරමුණ ඇතිව සාගර සම්පත් පිළිබඳව විධිමත් වැඩිදුර අධ්‍යයනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.202/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවේ මත්ස්‍ය සම්පත විදේශිකයින් විසින් නෙලා ගැනීම වළකාලීම,— ශ්‍රී ලාංකික ධීවරයන්ට විශාල ආර්ථික අවාසියක් ඇති කරමින් ශ්‍රී ලංකා මුහුදු කලාපයේ මත්ස්‍ය සම්පත් විදේශිකයින් විසින් නෙලා ගන්නා බැවින් ශ්‍රී ලංකා මුහුදු කලාපය තුළ මාළු ඇල්ලීමට සහ විදේශ යාත්‍රාවලට මාළු බෑම සඳහා තොටුපලක් ලෙස භාවිතා කිරීම වළකාලීම සඳහා රජය විසින් විධිමත් වැඩ පිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.203/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— කොස් නිෂ්පාදනය වැඩි කර ඒ ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීම,— ඉතා ප්‍රනීත මෙන්ම ඖෂධීය ගුණයෙන් අනූන, රසායනික ද්‍රව්‍යවලින් තොරව වගා කළ හැකි බෝගයක් වන කොස් වගාව ව්‍යාප්ත කිරීම තුළින් ඒ ආශ්‍රිත නිෂ්පාදන ඉහළ නංවා ඒවා අපනයනය කිරීම මගින් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් අප රටට උපයා ගත හැකි බැවින් ඒ සඳහා රජයේ මැදිහත්වීමෙන් විධිමත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.204/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ගොවි සම්මාන උළෙලක් වාර්ෂිකව සංවිධානය කිරීම, — රටක් පෙරට යාමට නම් මූලික වශයෙන් ගොවිතැනින් සශ්‍රික විය යුතු බැවින් රට සරු කරන ගොවි ජනතාවට සිය වෘත්තිය පිළිබඳ අභිමානයක් ඇතිවන පරිදි විධිමත් සංවිධාන ව්‍යුහයක් හරහා ක්‍රියාත්මක වන ගොවි සම්මාන උළෙලක් රජයේ මැදිහත්වීමෙන් වාර්ෂිකව සංවිධානය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.205/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— සහන මිලකට LED බල්බ පාරිභෝගික ජනතාවට ලබාදීම, — නිවාස ආලෝක කිරීමට යොදා ගන්නා ගුණාත්මක LED බල්බ මිල අධික බැවින්, විදුලිබල මණ්ඩලය මැදිහත්වී සහනදායි මිලකට හා ගෙවීමේ ක්‍රමයට මෙම බල්බ පාරිභෝගික ජනතාවට ලබාදී ජාතික වශයෙන් විදුලිය විශාල ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමටත්, LED බල්බ ජනතාව අතර ජනප්‍රිය කිරීම මගින් විදුලිබල මණ්ඩලයටද අමතර ආදායමක් උපයා ගැනීමටත් හැකිවන පරිදි ක්‍රමවත් වැඩ පිළිවෙළක් සැකසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.206/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— සුළු පරිමාණ සෙල්ලම් බඩු කර්මාන්තශාලා ව්‍යාප්ත කිරීම, — ශ්‍රී ලංකාව තුළ සෙල්ලම් බඩු සඳහා විශාල වෙළඳපොළක් පැවතුණ ද, රට තුළ ඒවා නිෂ්පාදනය කෙරෙන්නේ සුළු වශයෙන් වන අතර ඒ සඳහා චීනය ප්‍රමුඛ අනෙකුත් රටවලට විදේශ විනිමය විශාල ප්‍රමාණයක් ඇදී යන බැවින්, සුළු පිරිවැයක් දැරිය යුතු මෙම කර්මාන්තය ග්‍රාමීය ප්‍රදේශවල ව්‍යාප්ත කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.208/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ ඖෂධ නිෂ්පාදන කර්මාන්ත ශාලා ආරම්භ කිරීම,— ශ්‍රී ලංකාව තුළ ඖෂධ නිෂ්පාදනය දැනට ඉතා අවම මට්ටමක පවතින අතර ඖෂධ ආනයනය සඳහා වසරකට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වැයවන බැවින් දියුණු මානව සම්පතක් හිමි රටක් ලෙස ශ්‍රී ලංකාවට අත්‍යාවශ්‍ය ඖෂධ වර්ග රට තුළම නිපදවීමට අවශ්‍ය පහසුකම් රජය මැදිහත් වීමෙන් ලබා දී ඖෂධ නිෂ්පාදන කර්මාන්ත ශාලා ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.209/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් විෂය නිර්දේශයට මනෝ විද්‍යාව විෂයය ඇතුළත් කිරීම,— පාසල් ශිෂ්‍ය ප්‍රජාව නිරෝගී මනසකින් යුත් බුද්ධිමත් තීරණ ගැනීමට හැකි පිරිසක් ලෙස හැඩගැස්වීම උදෙසා හය වැනි ශ්‍රේණියේ සිට ක්‍රියාත්මක වන පරිදි බෞද්ධ මනෝ විද්‍යාව සහ බටහිර මනෝ විද්‍යාව යන විෂයයන් ඒකාබද්ධ කොට ක්‍රමවත්ව සැලසුම් කරන ලද "මනෝ විද්‍යාව සහ භාවනාව" නමින් විෂයයක් පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.210/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්‍රාමික ආධාරක මධ්‍යස්ථාන පිහිටුවීම,— විශ්‍රාමිකයන් වෙනුවෙන් උපදේශන සේවා, වෛද්‍ය පහසුකම් සහ දිවා සුරැකුම් සේවා යනාදී වැඩිහිටියන්ට අවශ්‍ය සුබසාධන කටයුතු රැසක් එකම ස්ථානයකින් ඉටු කර ගැනීමට හැකි වන පරිදි විශ්‍රාමික ආධාරක මධ්‍යස්ථාන ගොඩනැංවීමටත්, එම මධ්‍යස්ථාන කේන්ද්‍ර කර ගනිමින් යම් නිෂ්පාදන කටයුත්තක් සඳහා විශ්‍රාමිකයන් යොමු කිරීම හරහා ඔවුන්ගේ දිවියට සහනයක් ලබාදෙන අතර අමතර ආදායමක් ද උපයා ගැනීමට හැකි වන ලෙස රජය මැදිහත් වීමෙන් රටපුරා විශ්‍රාමික ආධාරක මධ්‍යස්ථාන පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.211/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්‍රාමිකයන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා නව ලොතරැයියක් හඳුන්වා දීම,— විශ්‍රාමික රාජ්‍ය සේවකයන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීමට සහ ඔවුන්ගේ සුබසාධන කටයුතු සඳහා අවශ්‍ය මුදල් සොයා ගැනීම සඳහා නව ලොතරැයියක් වෙළඳපොළට හඳුන්වාදීමට රජය කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.